| | වෙනත් දීමනා | 7,965,000 | 2,964,890 | |
| | 5.විශේෂ දීමනා | | | |
| | 6.ජීවනාධාර දීමනා | | | 5,126,000 |
| | 9.i.අන්තර් දීමනා | | | |
| | ii.සභික දීමනා | | | 642,000 |
| | iii.භාෂා දීමනා | | | |
| | iv.දේපල ණය රජයේ දායකත්වය | | | |
| | ix.දිරි දීමනා | | | 2,000 |
| | x.විධායක දීමනා | | | |
| | xiii.සභික කාර්ය මණ්ඩල දීමනා | | | |
| | xii.ක්ෂේත්‍ර දිමනා | | | |
| | **එකතුව** | **16,325,000** | **7,148,055** | **17,920,000** |
| | **302 ගමන් වියදම්** | | | |
| 3.3 | 1. ගමන් වියදම් (දේශීය) | 20,000 | 10,250 | 20,000 |
| | **එකතුව** | **20,000** | **10,250** | **20,000** |
| 3.3 | **303 සැපයුම් හා උපකරණ** | | | |
| | 1.ලිපිද්‍රව්‍ය හා උපකරණ | 100,000 | - | 86,000 |
| | 2.ඉන්ධන හා ස්නේහක තෙල් | 2,200,000 | 667,876 | 2,000,000 |
| | 3.කාර්මික හා විදුලි උපකරණ | 20,000 | 20,000 | 10,000 |
| | 4.තැනීම් ද්‍රව්‍ය | 500,000 | - | 500,000 |
| | 6.සංග්‍රහ වියදම් | 150,000 | - | 100,000 |
| | 7.නිළ ඇඳුම් | 84,000 | 28,000 | 56,000 |
| | 9.වෙනත් ගබඩා ද්‍රව්‍ය | 50,000 | - | 50,000 |
| | **එකතුව** | **3,104,000** | **715,876** | **2,802,000** |
| 3.3 | **304 ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව** | | | |

| | | | | |
|---|---|---|---|---|
| | 2.යන්ත්‍රසූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව | 1,400,000 | 888,429 | 1,900,000 |
| | 7.මාර්ග,පාලම් බෝක්කු ආදිය අළුත්වැඩියාව හා නඩත්තු | 3,500,000 | - | 4,000,000 |
| | 9.වෙනත් අළුත්වැඩියාව හා නඩත්තු | 350,000 | 82,500 | 350,000 |
| | **එකතුව** | **5,250,000** | **970,929** | **6,250,000** |
| 3.3 | **305 ප්‍රවාහන සම්බන්ධක හා අවශ්‍යක සේවා** | | | |
| | 9.5.වෙනත්/නිතීඥ ගාස්තු-වෙනත් | 1,000,000 | - | 500,000 |
| | **එකතුව** | **1,000,000** | **-** | **500,000** |
| 3.3 | **307 ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර** | | | |
| | 7.7.1.වාහන රක්ෂණය | 400,000 | 187,761 | 250,000 |
| | **එකතුව** | **400,000** | **187,761** | **250,000** |
| 3.3 | **308 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂිකය** | | | |
| | 4.අර්ථසාධක | 105,000 | - | - |
| | **එකතුව** | **105,000** | **-** | **-** |
| | **පුනරාවර්ථන වියදම්** | **26,204,000** | **9,032,871** | **27,742,000** |
| 3.3 | **309. ප්‍රාග්ධන වැය** | | | |
| | 9.2.යන්ත්‍ර හා උපකරණ | 600,000 | | 500,000 |
| | 9.9.1.පළාත් නිශ්චිත ආධාර | 8,000,000 | 264,012 | 20,000,000 |
| | 9.9.2.පළාත් ආයෝජන | 500,000 | | 800,000 |
| | 9.9.3.විමධ්‍යගත ආධාර | 5,000,000 | | 500,000 |
| | 9.9.4.වෙනත් | | | 10,000,000 |
| | 9.9.5.සභා කර්මාන්ත | 16,500,000 | 1,655,059 | 10,000,000 |
| | 9.9.5.1.මන්ත්‍රී ප්‍රතිපාදන | | | |
| | 9.9.5.2.සභා කාර්යයන් | | | |
| | **එකතුව** | **30,600,000** | **1,919,071** | **41,800,000** |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **30,600,000** | **1,919,071** | **41,800,000** |
| | **පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය එකතුව** | **56,804,000** | **10,951,942** | **69,542,000** |

වැඩසටහන් අංක **05** වෙනත් පොදු උපයෝගී සේවා - ව්‍යාපෘති අංක **02**

| වැය සංකේ | වැය විෂය විස්තර | 2025 ඇස්තමේන්තුව | 2025.06.30 ට සත්‍ය වියදම | 2026 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|
| 5.2 | **501 වැටුප් හා දීමනා** | | | |
| | 1.මූලික වැටුප i ස්ථිර | 400,000 | 265,579 | 618,000 |
| | ii දෛනික | | | |
| | 2.අතිකාල හා නිවාඩු දින වැටුප් | | | |
| | වෙනත් දීමනා | 320,000 | 144,300 | |
| | 5.විශේෂ දීමනා | | | |
| | 6.ජීවනාධාර දීමනා | | | 213,000 |

| | | | | |
|---|---|---|---|---|
| | 9.i.අන්තර් දීමනා | | | |
| | ii.සභික දීමනා | | | |
| | iii.භාෂා දීමනා | | | |
| | iv.දේපල ණය රජයේ දායකත්වය | | | 56,000 |
| | ix.දිරි දීමනා | | | |
| | x.විධායක දීමනා | | | |
| | xiii.සභික කාර්ය මණ්ඩල දීමනා | | | |
| | xii.ක්ෂේත්‍ර දිමනා | | | |
| | **එකතුව** | **720,000** | **409,879** | **887,000** |
| 5.2 | **503 සැපයුම් හා උපකරණ** | | | |
| | 7.නිළ ඇදුම් | 15,000 | - | 15,000 |
| | **එකතුව** | **15,000** | **-** | **15,000** |
| 5.2 | **504 ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව** | | | |
| | 1.ඉඩම් හා ගොඩනැගිලි අළුත්වැඩියාව හා නඩත්තුව | 1,500,000 | 4,595 | 100,000 |
| | **එකතුව** | **1,500,000** | **4,595** | **100,000** |
| 5.2 | **505 ප්‍රවාහන සම්බන්ධක හා අවශ්‍යක සේවා** | | | |
| | 3.1. විදුලිය/ජලය | 1,250,000 | 265,664 | 400,000 |
| | **එකතුව** | **1,250,000** | **265,664** | **400,000** |
| 5.2 | **507 ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර** | | | |
| | **එකතුව** | **-** | **-** | **-** |
| | **පුනරාවර්ථන වියදම්** | **3,485,000** | **680,138** | **1,402,000** |
| 5.2 | **509. ප්‍රාග්ධන වැය** | | | |
| | 9.1.ඉඩම් හා ගොඩනැගිලි | 100,000 | - | 100,000 |
| | 9.2.යන්ත්‍ර හා උපකරණ | 100,000 | - | 100,000 |
| | **එකතුව** | **200,000** | **-** | **200,000** |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **200,000** | **-** | **200,000** |
| | **පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය එකතුව** | **3,685,000** | **680,138** | **1,602,000** |

<u>වැඩසටහන් අංක 05 වෙනත් පොදු උපයෝගී සේවා - ව්‍යාපෘති අංක 03 වීථි ආලෝක කිරීම්</u>

| වැය සංකේ | වැය විෂය විස්තර | 2025 ඇස්තමේන්තුව | 2025.06.30 ට සත්‍ය වියදම | 2026 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|
| 5.3 | **501 වැටුප් හා දීමනා** | | | |
| | 1.මුලික වැටුප i ස්ථිර | 310,000 | - | 484,000 |
| | ii දෛනික | | | |
| | 2.අතිකාල හා නිවාඩු දින වැටුප් | | | |
| | වෙනත් දීමනා | 304,000 | - | |
| | 5.විශේෂ දීමනා | | | |
| | 6.ජීවනාධාර දීමනා | | | 213,000 |
| | 9.i.අන්තර් දීමනා | | | |
| | ii.සභික දීමනා | | | |

| | | | | |
|---|---|---|---|---|
| | iii.භාෂා දීමනා<br>iv.දේපල ණය රජයේ දායකත්වය<br>ix.දිරි දීමනා<br>x.විධායක දීමනා<br>xiii.සභික කාර්ය මණ්ඩල දීමනා<br>xii.ක්ෂේත්‍ර දිමනා | | | |
| | **එකතුව** | **614,000** | **-** | **697,000** |
| 5.3 | **503 සැපයුම් හා උපකරණ**<br>1.ලිපිද්‍රව්‍ය හා උපකරණ<br>2.ඉන්ධන හා ස්නේහක තෙල්<br>3.කාර්මික හා විදුලි උපකරණ | <br><br>300,000<br>1,500,000 | <br><br>100,210<br>923,200 | <br><br>250,000<br>1,500,000 |
| | **එකතුව** | **1,800,000** | **1,023,410** | **1,750,000** |
| 5.3 | **504 ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව**<br>2.යන්ත්‍රසූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව | 300,000 | 72,190 | 300,000 |
| | **එකතුව** | **300,000** | **72,190** | **300,000** |
| 5.3 | **507 ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර**<br>7.7.1.වාහන රක්ෂණය | 60,000 | 20,367 | 30,000 |
| | **එකතුව** | **60,000** | **20,367** | **30,000** |
| | **පුනරාවර්ථන වියදම්** | **2,774,000** | **1,115,967** | **2,777,000** |

<u>වැඩසටහන් අංක **05** පොදු උපයෝගී සේවා - ව්‍යාපෘති අංක **05** ජල හා සනිපාරක්ෂක</u>

| වැය සංකේ | වැය විෂය විස්තර | **2025** ඇස්තමේන්තුව | **2025.06.30** ට සත්‍ය වියදම | **2026** ඇස්තමේන්තුව |
|---|---|---|---|---|
| 5.5 | **504 ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව**<br>9.වෙනත් අළුත්වැඩියාව හා නඩත්තුව<br>9.1.නළ ලිං අළුත්වැඩියාව<br>9.2.පොදු ලිං අළුත්වැඩියාව<br>9.3.ජල ව්‍යාපෘති අළුත්වැඩියාව<br>9.4.පොදු වැසිකිළි අළුත්වැඩියාව | <br><br>150,000<br>200,000<br>10,000<br>500,000 | <br><br>67,260<br>-<br>-<br>- | <br><br>150,000<br>200,000<br>20,000<br>500,000 |
| | **එකතුව** | **860,000** | **67,260** | **870,000** |
| 5.5 | **507 ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර**<br>7.1.සහනාධාර- වැසිකිළි උපකරණ ලබා දීම | 700,000 | - | 700,000 |
| | **එකතුව** | **700,000** | **-** | **700,000** |
| | **පුනරාවර්ථන වියදම්** | **1,560,000** | **67,260** | **1,570,000** |
| | **පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය එකතුව** | **1,560,000** | **67,260** | **1,570,000** |

| වැය සංකේ | වැය විෂය විස්තර | 2025 ඇස්තමේන්තුව | 2025.06.30 ට සත්‍ය වියදම | 2026 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|
| 6.2 | **601 වැටුප් හා දීමනා** | | | |
| | 1.මූලික වැටුප i ස්ථිර | 3,435,000 | 1,683,235 | 5,529,000 |
| | ii දෛනික | | | |
| | 2.අතිකාල හා නිවාඩු දින වැටුප් | | | |
| | වෙනත් දීමනා | 3,186,000 | 1,149,714 | |
| | 5.විශේෂ දීමනා | | | |
| | 6.ජීවනාධාර දීමනා | | | 2,136,000 |
| | 9.i.අන්තර් දීමනා | | | |
| | ii.සභික දීමනා | | | |
| | iii.භාෂා දීමනා | | | |
| | iv.දේපල ණය රජයේ දායකත්වය | | | |
| | ix.දිරි දීමනා | | | |
| | x.විධායක දීමනා | | | |
| | xiii.සභික කාර්ය මණ්ඩල දීමනා | | | |
| | xii.ක්ෂේත්‍ර දීමනා | | | |
| | එකතුව | **6,621,000** | **2,832,949** | **7,665,000** |
| 6.2 | **603 සැපයුම් හා උපකරණ** | | | |
| | 1.ලිපිද්‍රව්‍ය හා උපකරණ | 50,000 | 41,009 | 50,000 |
| | 7.නිළ ඇඳුම් | 20,000 | 20,000 | 20,000 |
| | 9.1වෙනත් ගබඩා ද්‍රව්‍ය | 3,000 | - | 1,000 |
| | 9.2 පුවත්පත් සඟරා | 400,000 | 206,360 | 375,000 |
| | එකතුව | **473,000** | **267,369** | **446,000** |
| 6.2 | **604 ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව** | | | |
| | 1.ඉඩම් හා ගොඩනැගිලි අළුත්වැඩියාව හා නඩත්තුව | 700,000 | - | 100,000 |
| | 2.යන්ත්‍රසූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව | 30,000 | - | 30,000 |
| | එකතුව | **730,000** | **-** | **130,000** |
| 6.2 | **605 ප්‍රවාහන සම්බන්ධක හා අවශ්‍යක සේවා** | | | |
| | 2.සම්බන්ධක සේවා /දුරකථන | 40,000 | 18,634 | 40,000 |
| | 3.1. විදුලිය/ජලය | 245,000 | 54,210 | 100,000 |
| | එකතුව | **285,000** | **72,844** | **140,000** |
| 6.2 | **607 ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර** | | | |
| | 7.1.අධ්‍යාපන ප්‍රදර්ශන | 50,000 | - | 50,000 |
| | එකතුව | **50,000** | **-** | **50,000** |
| | පුනරාවර්ථන වියදම් | **8,159,000** | **3,173,163** | **8,431,000** |
| 6.2 | **609. ප්‍රාග්ධන වැය** | | | |
| | 9.1.ඉඩම් හා ගොඩනැගිලි | | | 500,000 |

| | | | | |
|---|---|---|---|---|
| | 9.2.යන්ත්‍ර හා උපකරණ | 500,000 | 12,400 | 500,000 |
| | 9.5 පුස්තකාල පොත් | 950,000 | | 1,100,000 |
| | **එකතුව** | **1,450,000** | **12,400** | **2,100,000** |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **1,450,000** | **12,400** | **2,100,000** |
| | **පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය එකතුව** | **9,609,000** | **3,185,563** | **10,531,000** |

-

<u>වැඩසටහන් අංක **06** සුබ සාධක සේවා - ව්‍යාපෘති අංක **03** ප්‍රජාශාලා ක්‍රීඩා භූමි ළමා උද්‍යාන</u>

| වැය සංකේ | වැය විෂය විස්තර | **2025** ඇස්තමේන්තුව | **2025.06.30** ට සත්‍ය වියදම | **2026** ඇස්තමේන්තුව |
|---|---|---|---|---|
| 6.3 | **601** **වැටුප් හා දීමනා** | | | |
| | 1.මූලික වැටුප i ස්ථිර | 612,000 | 203,670 | 526,000 |
| | ii දෛනික | | | |
| | 2.අතිකාල හා නිවාඩු දින වැටුප් | | | |
| | වෙනත් දීමනා | 637,000 | 144,300 | |
| | 5.විශේෂ දීමනා | | | |
| | 6.ජීවනාධාර දීමනා | | | 214,000 |
| | 9.i.අන්තර් දීමනා | | | |
| | ii.සභික දීමනා | | | |
| | iii.භාෂා දීමනා | | | |
| | iv.දේපල ණය රජයේ දායකත්වය | | | |
| | ix.දිරි දීමනා | | | |
| | x.විධායක දීමනා | | | |
| | xiii.සභික කාර්ය මණ්ඩල දීමනා | | | |
| | xii.ක්ෂේත්‍ර දිමනා | | | |
| | **එකතුව** | **1,249,000** | **347,970** | **740,000** |
| 6.3 | **603** **සැපයුම් හා උපකරණ** | | | |
| | 1.ලිපිද්‍රව්‍ය හා උපකරණ | 5,000 | 4,700 | 5,000 |
| | **එකතුව** | **5,000** | **4,700** | **5,000** |
| 6.3 | **604** **ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව** | | | |
| | 1.ඉඩම් හා ගොඩනැගිලි අළුත්වැඩියාව හා නඩත්තුව | 200,000 | - | 200,000 |
| | 9.1 සුසාන භූමි නඩත්තුව | 300,000 | - | 500,000 |
| | 9.2 ක්‍රීඩා භූමි නඩත්තුව | 300,000 | - | 300,000 |
| | **එකතුව** | **800,000** | **-** | **1,000,000** |
| 6.3 | **605** **ප්‍රවාහන සම්බන්ධක හා අවශ්‍යක සේවා** | | | |
| | 3.1. විදුලිය/ජලය | 435,000 | 114,338 | 300,000 |
| | 7.1 මුද්‍රණ ගාස්තු-මුද්‍රණ කටයුතු | | | |
| | **එකතුව** | **435,000** | **114,338** | **300,000** |
| | **පුනරාවර්ථන වියදම්** | **2,489,000** | **467,008** | **2,045,000** |

| | | | | |
|---|---|---|---|---|
| 6.3 | **609. ප්‍රාග්ධන වැය** | | | |
| | 9.1.ඉඩම් හා ගොඩනැගිලි | | | 1,000,000 |
| | 9.2.යන්ත්‍ර හා උපකරණ | 500,000 | - | 100,000 |
| | 9.3.වෙනත් | | | |
| | **එකතුව** | **500,000** | **-** | **1,100,000** |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **500,000** | **-** | **1,100,000** |
| | **පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය එකතුව** | **2,989,000** | **467,008** | **3,145,000** |

**<u>වැඩසටහන් අංක 06 සුභ සාධක සේවා - ව්‍යාපෘති අංක 06 ප්‍රජා සංවර්ධන</u>**

| වැය සංකේ | වැය විෂය විස්තර | **2025** ඇස්තමේන්තුව | **2025.06.30** ට සත්‍ය වියදම | **2026** ඇස්තමේන්තුව |
|---|---|---|---|---|
| 6.6 | **603 සැපයුම් හා උපකරණ** | | | |
| | 1.ලිපිද්‍රව්‍ය හා උපකරණ | 20,000 | 14,980 | 20,000 |
| | 6.සංග්‍රහ වියදම් | 50,000 | 1,344 | 50,000 |
| | **එකතුව** | **70,000** | **16,324** | **70,000** |
| 6.6 | **605 ප්‍රවාහන සම්බන්ධක හා අවශ්‍යක සේවා** | | | |
| | 7.1 මුද්‍රණ ගාස්තු-මුද්‍රණ කටයුතු | 10,000 | 2,900 | 10,000 |
| | **එකතුව** | **10,000** | **2,900** | **10,000** |
| 6.6 | **607 ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර** | | | |
| | 1.රුක්රෝපණ වැඩසටහන් | 50,000 | 32,850 | 50,000 |
| | 2.ශ්‍රමදාන වැඩසටහන් | 20,000 | | 20,000 |
| | 3.ගෙවතු වගා තරඟ සඳහා | 150,000 | | 150,000 |
| | 4.මා ඔය සංරක්ෂණ වැඩසටහන් | 50,000 | | 20,000 |
| | 5.වෙනත් පරිසර වැඩසටහන් | 50,000 | 11,325 | 15,000 |
| | 6.සාහිත්‍ය මාසය,කියවීම් මාසය | 250,000 | | 250,000 |
| | 7.අඩු පහසුකම් සහිත පාසල් වල දරුවන්ට අධ්‍යාපන අධාර ලබාදීම | 250,000 | 25,114 | 250,000 |
| | 8.ප්‍රජා මණ්ඩල සඳහා ආධාර | 100,000 | | 100,000 |
| | 9.ජගත්වැඩිහිටි දින උත්සව කටයුතු | 100,000 | | 150,000 |
| | 10.පළාත් පාලන සතිය වෙනුවෙන් | 50,000 | | 50,000 |
| | 11.ජංගම සේවා වැඩසටහන් සඳහා | 250,000 | | 300,000 |
| | 12.සෞඛ්‍ය කම්කරුවන් සඳහා සායන වැඩහටහන් | 100,000 | 12,500 | 100,000 |
| | 13.ක්‍රීඩා උත්සව හා ක්‍රීඩා සංවර්ධන ආධාර | 150,000 | | 100,000 |
| | 14.අන්තර් පළාත් වොලිබෝල් තරග | 150,000 | | 200,000 |

| | | | | |
|---|---|---|---|---|
| | 15.අඩු ආදායම්ලාභීන් දිලිදුකමින් නිදහස් කිරීමේ ව්‍යාපෘතිය සදහා | 50,000 | | 200,000 |
| | 16.කාන්තා දිරිගැන්වීම් - ස්වයංරැකියා | 100,000 | | 150,000 |
| | 17.ආගමික වැඩසටහන් | 100,000 | | 100,000 |
| | 18.මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 30,000 | | 50,000 |
| | 19.තරුණ ආකල්ප සංවර්ධනය කිරීමේ වැඩසටහන් | 75,000 | | 50,000 |
| | 20.සුබ සාධක සංගමයට ආධාර | 100,000 | | 100,000 |
| | 21.සේවක ප්‍රජා නායක හමුව | 40,000 | | 10,000 |
| | 22.සෞඛ්‍ය අංශයේ සේවකයින්ගේ ක්ෂේත්‍ර චාරිකා | 150,000 | | 150,000 |
| | 23.අඩු ආදායම්ලාභීන් සදහා නිවාස ආධාර | 500,000 | | 500,000 |
| | 24.මහජන ආධාර සදහා | 250,000 | 25,000 | 300,000 |
| | 25.ආපදා වැඩසටහන් සදහා | 200,000 | | 200,000 |
| | 26.සේවා ඇගයීම හා සේවක අභිප්‍රේරණය | 250,000 | | 350,000 |
| | 27.විශේෂ ව්‍යාපෘති සදහා | | | 100,000 |
| | 28.ලෝක ළමාදින වැඩසටහන් | 275,000 | | 100,000 |
| | 29.දිළිදුකම තුරන් කිරීමේ වැඩසටහන (සහජීවන ගම) | 100,000 | | - |
| | 30.ආහාර සුරක්ෂිතතාවය | 50,000 | 7,390 | 50,000 |
| | 31.ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය | 50,000 | | 20,000 |
| | 32 ව්‍යවසායකයින් නගාසිටුවීම | 50,000 | | 50,000 |
| | 33 වෙනත් | 20,000 | 4,200 | 20,000 |
| | **එකතුව** | **4,110,000** | **118,379** | **4,255,000** |
| | **පුනරාවර්තන වැය එකතුව** | **4,190,000** | **137,603** | **4,335,000** |

**වැඩසටහන් අංක 06 සුභ සාධක සේවා - ව්‍යාපෘති අංක 07 ළඳරු පාසල්**

| වැය සංකේ | වැය විෂය විස්තර | 2025 ඇස්තමේන්තුව | 2025.06.30 ට සත්‍ය වියදම | 2026 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|
| - | - | - | - | - |
| 6.7 | **601 වැටුප් හා දීමනා** | | | |
| | 1.මූලික වැටුප i ස්ථිර<br>ii දෛනික | 1,630,000 | 550,824 | 4,176,000 |
| | 2.අතිකාල හා නිවාඩු දින වැටුප් | | | |
| | වෙනත් දීමනා | 1,593,000 | 397,300 | |
| | 5.විශේෂ දීමනා | | | |
| | 6.ජීවනාධාර දීමනා | | | 1,708,000 |

| | | | | |
|---|---|---|---|---|
| | 9.i.අන්තර් දීමනා<br>ii.සභික දීමනා<br>iii.භාෂා දීමනා<br>iv.දේපල ණය රජයේ දායකත්වය<br>ix.දිරි දීමනා<br>x.විධායක දීමනා<br>xiii.සභික කාර්ය මණ්ඩල දීමනා<br>xii.ක්ෂේත්‍ර දිමනා | | | |
| | **එකතුව** | **3,223,000** | **948,124** | **5,884,000** |
| 6.7 | **603 සැපයුම් හා උපකරණ** | | | |
| | 1.ලිපිද්‍රව්‍ය හා උපකරණ | 30,000 | - | 10,000 |
| | 6.සංග්‍රහ වියදම් | 50,000 | - | 20,000 |
| | 9.වෙනත් ගබඩා ද්‍රව්‍ය | 4,000 | - | 4,000 |
| | **එකතුව** | **84,000** | **-** | **34,000** |
| 6.7 | **604 ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව** | | | |
| | 1.ඉඩම් හා ගොඩනැගිලි අළුත්වැඩියාව හා නඩත්තුව | 100,000 | - | 100,000 |
| | **එකතුව** | **100,000** | **-** | **100,000** |
| 6.7 | **605 ප්‍රවාහන සම්බන්ධක හා අවශ්‍යක සේවා** | | | |
| | 3.1. විදුලිය/ජලය | 20,000 | 3,402 | 15,000 |
| | **එකතුව** | **20,000** | **3,402** | **15,000** |
| 6.7 | **607 ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර** | | | |
| | 7.1.1.පෙර පාසල් දීමනාව | 456,000 | 72,000 | 456,000 |
| | 7.1.2.පෙර පාසල් වර්ෂ අවසාන උත්සවය | - | | 200,000 |
| | 7.1.3.දෙමාපිය වැඩසටහන් | 30,000 | | 30,000 |
| | 7.1.4.ළමා වැඩසටහන් | 50,000 | | 50,000 |
| | 7.1.5.ගුරු පුහුණු වැඩසටහන් | 50,000 | | 50,000 |
| | 7.1.6.සිගිති ඇසළ පෙරහැර | 50,000 | 16,250 | 50,000 |
| | **එකතුව** | **636,000** | **88,250** | **836,000** |
| | **පුනරාවර්ථන වියදම්** | **4,063,000** | **1,039,777** | **6,869,000** |
| 6.7 | **609. ප්‍රාග්ධන වැය** | | | |
| | 9.2.යන්ත්‍ර හා උපකරණ | 200,000 | - | 200,000 |
| | **එකතුව** | **200,000** | **-** | **200,000** |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **200,000** | **-** | **200,000** |
| | **පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය එකතුව** | **4,263,000** | **1,039,777** | **7,069,000** |

## 2026 - සංවර්ධන යෝජනාව

| අ/අ | කොට්ඨාසය | සංවර්ධන යෝජනාව | වටිනාකම |
|---|---|---|---|
| 1 | ගල්ගමුව | විල්ගමුව වැව මාර්ගය සංවර්ධනය කිරීම. NWP /ALP/C05/5/7 | 350,000.00 |
| 2 | කන්දෙගෙදර | කන්දෙගෙදර කොස්ගහමඩ සමිති ශාලාව අසලින් දිවෙන මාර්ගය සංවර්ධනය කිරීම. NWP/ ALP/C05/5/2/3 | 350,000.00 |
| 3 | | හෙන්ඩුවාවත්ත නීල් රූපසිංහ මහතාගේ නිවස අසලින් යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 350,000.00 |
| 4 | මහරච්චිමුල්ල | වෙන්නොරුව පාසල ඉදිරිපිට මාර්ගය පෙර පාසල දක්වා සංවර්ධනය කිරීම. NWP/ ALP/ C09/10 | 350,000.00 |
| 5 | | මහරච්චිමුල්ල පින්නගොල්ල වත්ත දක්වා යන මාර්ගය සංවර්ධනය කිරීම. NWP/ALP/ B8/16 | 350,000.00 |
| 6 | නුංගමුව | ඊනගල පන්සල අසල සිට පහළවත්ත දක්වා දිවෙන මාර්ගයේ මාලා දමයන්තිගේ කුඹුර අසල පැති බැම්ම සකස් කිරීම. NWP/ALP/C/06/03 | 350,000.00 |
| 7 | | හෙම්මාත මාර්ගයේ ඉතිරි කොටස් කොන්ක්‍රීට් කිරීම. NWP/ALP/C1/01/29 | 350,000.00 |
| 8 | වඩුවාව | පොරමඩල කනත්ත පාරේ අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් කිරීම. NWP/ALP/C01/9 | 350,000.00 |
| 9 | | හගවත්ත පහල නිමල් මහතාගේ කඩය අසලින් සුදා මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම. NWP/ALP/C01/2/2/F | 350,000.00 |
| 10 | වැත්තැව | ඉහළ වැත්තැව වසමේ ජේෂ කර්ම මධ්‍යස්ථානය අසලින් වෙල්යායට යාබදව දිවෙන මාර්ගය සංවර්ධනය කිරීම. | 350,000.00 |
| 11 | නුගවෙල | ඉහළ කළල් පිටිය බුදුමැදුර අසලින් (පියදාස මහතාගේ නිවස අසල)සුවිනීතා චන්ද්‍රකාන්ති මහත්මියගේ නිවස අසලට දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම. NWP/ALP/C04/6/4 | 350,000.00 |
| 12 | බෝයවලාන | උඩවලවත්ත සිට කිරිවාන දක්වා මාර්ගයේ පැති බැම්ම සැකසීම. NWP/ALP/C05/9/6/1 | 350,000.00 |

| | | | |
|---|---|---|---|
| 13 | | පැපොල්ගස් ඉන්න චමින්ද මහතාගේ නිවස අසල සිට විජයරත්න මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරිම | 350,000.00 |
| 14 | නවතල්වත්ත | නවතල්වත්ත බෝගහ අසලින් පටන් ගෙන කිරුවන්පොල දක්වා දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම. NWP/ALP/D03/18 | 350,000.00 |
| 15 | | නාලක අබේධීර මහතාගේ නිවස අසලින් ආරම්භවන නවතල්වත්ත වැලි පාරේ මැද වංගුව බෝක්කුව දමා කොන්ක්‍රීට් කිරීම. NWP/ALP/C02/31 | 350,000.00 |
| 16 | හුම්බුළුව | හුම්බුළුව ආවාස ගෙදර ළගින් වමට පාරේ පැතිබැම්ම සහිතව කොන්ක්‍රීට් කිරීම. NWP/ALP/B9/32 | 350,000.00 |
| 17 | | මඩවල පාසල අසලින් ගංගොඩ දෙසට ඇති මාර්ගයේ අවශ්‍ය ස්ථාන සංවර්ධනය කිරීම. NWP/ALP/B9/40/1 | 350,000.00 |
| 18 | | උඩගන්කන්ද වසමේ සුසානභූමියට යන මාර්ගයේ ඉතිරි කොටස් කොන්ක්‍රීට් කිරීම. | 350,000.00 |
| 19 | අබ්බෝව | අස්සැද්දුම වීමෝල අසල සිට තුඹුල්ල ඇපලදෙනිය දේවාලය අසල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම. | 350,000.00 |
| 20 | | උඩගන්කන්ද තල්ගස්යාය මාර්ගය සංවර්ධන කිරීම. NWP/ALP/D11/6 | 350,000.00 |
| 21 | යත්තල්ගොඩ | බුජ්ජොමුව කැන්දහෙන ප්‍රධාන මාර්ගයේ විජිත මහතාගේ කඩය අසල සිට මාර්ගයේ පැති බැම්ම සෑදීම. | 350,000.00 |
| 22 | | යත්තල්ගොඩ ළදරු පාසල දක්වා මාර්ගය සංවර්ධන කිරීම. | 350,000.00 |
| 23 | | කැබැල්ලවිට සමිති ශාලාවට ඉදිරියෙන් ඇති මාර්ගයේ අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් කිරීම. NWP/ALP/B8/21/1 | 350,000.00 |
| 24 | පරමාඋල්ල | කැබැල්ලවිට කිරිබත්කොහේ සිට සුසානභූමිය,සමිති ශාලාව දෙසට පහලට බසින මාර්ගයේ කුසුමා ගුණවර්ධන මහත්මියගේ නිවස දකුණු පසින් ඇති මාර්ගය සංවර්ධන කිරීම. NWP/ALP/B8/21/1 | 350,000.00 |
| 25 | අලව්ව | කෝහිටියාව පරණවත්ත පාරේ සිට කොස් කැළය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම.(එරන්ද මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය) NWP/ALP/A6/5/10 | 550,000.00 |

| | | | |
|---|---|---|---|
| 26 | | ගොරොක්ගස්දෙනිය ගුරුගේ මහතාගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම. NWP/ALP/A6/5/4 | 350,000.00 |
| 27 | | ගොරොක්ගස්දෙනිය සමිතිශාලාව ඉදිරිපිටින් කොස්කැළය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම. NWP/ALP/A6/5/10/1 | 350,000.00 |
| 28 | කොහොලාන | ඉහළ වළකුඹුර කන්ද ජගත් මහතාගේ නිවස ඉදිරිපිට කොටස සංවර්ධනය කිරීම. | 350,000.00 |
| **එකතුව** | | | **10,000,000.00** |

අලව්ව ප්‍රාදේශීය සභාව

අයවැය සාරාංශය -2026

| ප්‍රභවය | මුදල | එකතුව |
|---|---|---|
| ආදායම් | | |
| ස්වයං උත්පාදන ආදායම | 114,915,000.00 | |
| ආදායම් ආධාර හා ප්‍රතිපූර්ණ | 89,216,000.00 | |
| ප්‍රාග්ධන ලැබීම් | 31,800,000.00 | |
| අපේක්ෂිත මුළු ආදායම් | | 235,931,000.00 |
| වියදම් | | |
| පුනරාවර්තන වියදම් | 186,056,000.00 | |
| ප්‍රාග්ධන වියදම් | 49,875,000.00 | |
| අපේක්ෂිත මුළු වියදම | | 235,931,000.00 |
| අතිරික්තය | | - |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා, අයවැය සම්බන්ධව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලාගෙන් අවසරයි. ඒ වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ගෙන් සහ ගරු සභාපතිතුමාගේ ලේකම් තුමා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව අපි ජයග්‍රහණය කරමින් අපේ මුල්ම අයවැය ගරු සභාපතිතුමා විසින් කෙටුම්පත් කරලා අද දින මංගල සභාවක් ලෙස ඉදිරිපත් කරා. අපි හැමෝගේම බලාපොරොත්තුව සහා තේමා ගීතයේ සඳහන් පරිදි "අලව් පුරයට සොඳුරු හෙට දවසක්" උදා කරන්න, ඒ සඳහා මහජන නියෝජිතයෝ විදිහට සභාපතිතුමාගේ නායකත්වයෙන් අලව්ව ප්‍රදේශයට සහ ජනතාවට ඔවුන්ගේ ජන ජීවිතය උසස් කිරීමේ ජීවන තත්වයක් ඔවුන්ට උදා කරලීමට එක්කාසු වෙමු.
මන් හිතන්නේ, ජොෂ්ඨ මන්ත්‍රීවරුන්ගේ බොහෝ අත්දැකීම් එක්කාසු කර ගනිමින්, ඔබ සියලුදෙනාගේම සහයෝගයත් සමඟ අපේ ගරු සභාපතිතුමාට 2026 වර්ෂය ශක්තිමත්ව මේ සභාව කරගෙන යාමට ලැබීම සම්බන්ධයෙන් නවක මන්ත්‍රීවරු විදිහට අපි ඉතාමත්ම සතුටු වෙනවා. ඒවගේම මම දකින විදිහට අපේ ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලය ඉතාම කැපවීමකින් මේ සඳහා සම්බන්ධ වුණා. ඉදිරියටත් එලෙසම පවතීවි. මන් හිතන්නේ අපි බලාපොරොත්තු වෙන "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' ගොඩනගන්නට, අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සංකල්පයත් සමඟ එක්කාසු වෙමින් අලව්ව පුරයට සොඳුරු හෙට දවසක් ගොඩ නගන්නට අපි සියලු දෙනාටම ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2006 ඉඳලා මම මේ සභාවේ අයවැය සම්බන්ධයෙන් සම්බන්ධ වුණා. මගේ සහෝදර සමන්ත යත්තල්ගොඩ මන්ත්‍රීතුමා 91 ඉඳලා අයවැය සම්මත කිරීමේ කටයුත්තට සම්බන්ධ වුණා. මේ අවස්ථාවේ දිවංගත සභාපති ගාමිණී ගුණදාස මැතිතුමා සිහිපත් කරන්න ඕනි. අලව්ව ප්‍රාදේශීය සභාවේ සම්ප්‍රදායක් තිබුණා, සියලුම මහජන මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයෙන් අයවැය සම්මත කළේ. සභාව තුළ බෙදීමක් ඇති වුණේ නැහැ, වාද විවාද අනන්ත අප්‍රමාණ සිදු වුණා. ඒත් කිසිම දවසක විපක්ෂයේ හිටිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සෙනරත් සුගතදාස මහතා ,එක්සත් ජාතික පක්ෂයේ ගාමිණී ගුණදාස මහතා වාද විවාද මැද අයවැය සම්බන්ධයෙන් රාත්‍රී 12 විතර වෙනකල් නාරම්මල සභාවේ සභාව පැවැත්වුවා. හැබැයි අයවැය සම්මත කරනකොට මුදල් ප්‍රතිපත්ති කාරක සභාවල සාකච්ඡාවලින් අවසන් ප්‍රතිඵලය ගත්තා. එහෙම ආපු ගමනක මේ සභාවේ අපි දන්න පොදු කාරණයක් තිබුණා මේ සභාවක අයවැය කියන්නේ බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතයට අදාල වන සියලු තීන්දු තීරණ ගන්න ආයතනයක් හැටියට අලව්ව නගරයේ කැලි කසල ඉවත් කරන තැන ඉඳලා තමා මේ සභාව ආරම්භ වෙන්නේ. ඒ කැලි කසල ඉවත් කර නගරයක් පිරිසිදුව පවත්වාගෙන යන තැන ඉඳලා බල ප්‍රදේශයේ ජනතාවගේ අනිකුත් පහසුකම් සියල්ලම කැටිකොට ගෙන සියලු දේවල් කරද්දී සභාවේ සහෝදර රාජ්‍ය නිලධාරීන් ලෙස සභාවකට පත්වන ලේකම්වරයා හෝ ලේකම්වරිය සමඟ එකට එකතු වෙලා සභාව ගෙනයාමේ ප්‍රධාන වගකීම අපිට පවතිනවා. අපි සභාවේ ආදායම් මෙච්චරයි එයින් කොටසක් හොරා කනවද දන් නැහැ කියලා මැතිවරණ කාලවලදී කියනවා. නමුත් සභාවක් ඇතුළට ඇවිත් සභා අයවැයවල ආදායම් හා වියදම් දෙක සසඳලා බැලුවහම, සියලු දෙනාටම තේරෙනවා සභාවේ කොච්චරක් ආදායම තියනවාද කොහොමද මේක ගෙනි යන්නේ කියලා. ගරු සභාපතිතුමාගේ සහ අපේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ යෝජනා සමඟ අයවැය හදන්නේ අපේ නිලධාරී මණ්ඩලය බව අපි දන්නවා. එහෙම හදලා මහජන මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කරලා අඩුපාඩු යෝජනා සකස් කරලා අයවැය එකට එකතු කරලා අවසානයේදී තමා මහසභාවේ තීන්දුවකට එන්නේ. එහෙම ඉදිරිපත් කරන අවස්ථාවක අයවැය ඒකත්ඡන්දයෙන් සම්මත කරගන්න පුළුවන්කම තියනකොට බොහොම හොඳයි. අපි අයවැයක් සම්මත කරනකොට, ගරු සභාපතිතුමනි, සභාවක සභාපතිවරයා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයක් හැටියට ඔබ කෙරේ විශ්වාසය තබමින් සහ මේ අයවැය හදන්න සම්බන්ධ වුණු විගණනය කියන එක තමන් පසුපස පැමිණෙන බව දැනගෙන නිවැරදිව අයවැය සකස් කරන නිලධාරී මණ්ඩලය ගැනත් තබන විශ්වාසය මතයි අපි අයවැය සම්මත කරන්නේ. ඒ නිසා අද මේ අයවැය සම්මත කරලා ඔබ අප සියලු දෙනාටම සතුටු වෙන්න පුළුවන් දෙයක් තියනවා ලබන අවුරුද්දේ ජනවාරියේ සිට ඔබට ගැටලුවකින් තොරව පළමුවෙන්ම නගරය පිරිසිදු කරන තැන ඉඳලා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේම සියලු ජනතාවගේම හුදු මහත් ප්‍රශ්නවලට මැදහත් වී කටයුතු කරන්න පුළුවන්.

මිනිස්සුන්ගේ ප්‍රශ්නවලට ඔවුන් මුලින්ම එන රාජ්‍ය ආයතනය ප්‍රාදේශීය සභාවයි. එහෙම එන මිනිස්සුන්ට දේශපාලනයක් නැහැ. සභාපතිවරයා කුමන පක්ෂයක් නියෝජනය කළත්, සභාවේ සභාපතිවරයා ලෙස පත්වුණාම සභාවේ සභාපතිවරයා මිසක් පක්ෂයක සභාපතිවරයෙක් නෙවේ. ඒ විශ්වාසය ඇතුව ඔබ ගාවට එනකොට සමහර වෙලාවට අපිට කතා කරාම කියන්නේ සභාපතිවරයාට ඉදිරිපත් කරන්න එතුමා නැත්නම් ලේකම්වරයාට ඉදිරිපත් කරන්න ඊට පසු මහසභාවට ගෙන එයි එදාට අපිට ප්‍රතිපාදන තිබ්බොත් කරන්න යමක් තිබුණොත් අපිට කරන්න පුළුවන් කියලා කියනවා. අතුකෝරාල මන්ත්‍රීතුමා පෞද්ගලික කාරණයක් නිසා අද සහභාගී වීමට නොහැකි බව ප්‍රකාශ කළත් අපි කණ්ඩායමේ කිසිම විරෝධතාවයක් නැහැ කියලා මතක් කරා. මේ අවස්ථාවේ ඔබට සහ අපට වගකීමක් තියනවා. මේ තියන ආදායමයි වියදමයි බැලුවහම, අපි අලුතින් ආදායම් උත්පාදනය කරන්න ඕනි. ඒ සඳහා ආදායම් මාර්ග උත්පාදනය කරන වැඩපිළිවෙලකුත් ලබන අවුරුද්දට යන්න වෙනවා. අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සන්තකේ ප්‍රාදේශීය සභාවට භාවිතා කරන්න පුළුවන් බිම් කොටස් ගණනාවක් පහුගිය කාලය පුරාවට සභාව සන්තක කර ගන්න උත්සාහ කරා. හේතුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පුද්ගලයෙක් කවුරු හරි ගිහින් පාරක ප්‍රශ්නයක් ඉදිරිපත් කළොත් ඒ ලියුම ආපහු මේ ගරු සභාවට එවනවා. එතකොට ඔබ අපි සියලු දෙනා එකතු වෙලා මුදල් හොයන කටයුත්ත කරන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අපි සතුවිය යුතු ඉඩම් ටික පවරන් නැතුව, එයාලගේ සන්තකයේ තියාගනිමින් එයාලත් ඒකේන් මුදල් උත්පාදනය කර මහ ආණ්ඩුවට යවනවා. නමුත් ප්‍රශ්න පත්‍රය අවසානයට ප්‍රාදේශීය සභාවට එනවා. ඒ නිසා මම පහුගිය කාලය පුරාවටම උත්සාහ කරා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව තිබුණ ඉඩම් සියල්ල සභාවට ගන්න. එයාලා කීවේ සභාවට කුලී පදනම මත හරි ව්‍යාපාරික ස්ථාන ඉදි කර දීමෙන් සභාවට හොඳ ආර්ථික මට්ටමක් උත්පාදනය කරගන්න හැකියාව ලැබෙනවා කියලා. ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම ඔබට සහ මන්ත්‍රී මණ්ඩලයට කියනවා දේශපාලන අධිකාරියට කතා කරලා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් කතා කරලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව තිබෙන අපට හිමිවිය යුතු ඉඩම් පවරා ගැනීමට කටයතු කරන්න කියලා. පෙලක් ඉඩම් අන්සතු වෙනකොට අපිට දුකකුත් එනවා. එදා පාලර් එකක අවශ්‍යතාවය පැන නගිනකොට පාලර් එක ගල්පොත්තේපොල හන්දියේ අපේ මාමණ්ඩි ග්‍රාම නිලධාරි ලෙස රජයේ බදු අය කරපු රදාවුල වත්ත පැත්තට වන ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ගන්න අවශ්‍ය කරන ලියකියවිලි එක්ක අපි කතා කරා. ඒක වැත්තැවේ මහතාට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කුලියට දීලා තිබුණා. යම්කිසි දෛනික ආදායමක් උත්පාදනය වන එක් උදාහරණයක් විතරයි සඳහන් කළේ. විශේෂයෙන්ම අද ඔබතුමා සතුටුවන්න ඔබේ පක්ෂයෙන් එදා අපිට අයවැයේදී විරුද්ධ වන එක තමා තීන්දුව දීලා තිබුණේ අයවැයට කලින් 2006 දී ගුණසේන මන්ත්‍රීතුමා, කපිල මන්ත්‍රීතුමාලා කියනවා කරන්න දෙයක් නැහැ පක්ෂ තීන්දුව අනුව අපි විරුද්ධ වෙනවා කියලා. හැබැයි මේ අයවැයේදී අපිට වැරැද්දක් පේන්න නැහැ. එදා එහෙම තීරණයක් ගත්තත්, අපි අනිත් පක්ෂ සියල්ල එකතු වෙලා අයවැය සම්මත කළා. නමුත් අද ඔබට ඒක ගැටලුවක් නොවෙන්න අපි සියලු දෙනා සහාය දීලා තියනවා. ඒ ලැබුණ සහයෝගය මත අලව්ව බල ප්‍රදේශයේ සියලු ජනතාවගේම ජන ජීවිතය සුඛිත මුදිත කිරීමේ අවස්ථාවේ එක අංශුමාත්‍රයක් ඉෂ්ට කරන්න තමා අපි අද අයවැය සම්මත කළේ. ඉතින් මේ අයවැයත් සමඟ තව අලුත් ආදායම් මාර්ග ලබන අවුරුද්දට උත්පාදනය කරගන්න පුළුවන් වැඩසටහන් සාකච්ඡා කරමින් සුභවාදී ගමනක් යමු කියලා ඉල්ලීම කරනවා. මේ සඳහා සම්බන්ධ වුණු සියලු දෙනාට මගේ ගෞරවය පුද කරන අතර, විශේෂයෙන් බදු ගෙවන මිනිසුන්ට හානියක් නොවන පරිදි එකතු කරගන්නේ කොහොමද යන සංකල්පයත් එක්ක මෙම අයවැය සකස් කිරීම සම්බන්ධව සුවිශේෂී කැපවීමක් සිදුකළ ලේකම්තුමිය ප්‍රමුඛ සමස්ථ කාර්ය මණ්ඩලයට මාගේ ගෞරවය පුද කරමින් මගේ කතාව අවසන් කරනවා සියලු දෙනාටම ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2026 වර්ෂය සඳහා අලව්ව ප්‍රාදේශීය සභාවේ ඉදිරිපත් වූ අයවැය ලේඛනය පිළිබඳව අදහස් ඉදිරිපත් වුණා. වසර ගණනාවක් අයවැය සම්බන්ධව කටයුතු කරලා තියනවා. ගරුමන්ත්‍රී මොහාන් වික්‍රමනායක මැතිතුමා කීවා වගේ අපි කිසිම දවසක අයවැයට විරුද්ධ වුණේ නැහැ. විශේෂයෙන්ම අපේ බල ප්‍රදේශයේ ජනතාව ගැන හිතලා හදන අයවැයක්. අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා කටයුතු කරන්නේ ජනතාවගේ උන්නතිය වෙනුවෙන්. ඒනිසා අපි මේ අයවැය පිළිබඳව අපේ කණ්ඩායම අධ්‍යයනය කළා, මේ අයවැයේ ජනතාවට අහිකතර කිසිවක් නැහැ. ඒ වගේම ජනතාව වෙනුවෙන් සකස් කරන ලද අයවැයක් නිසා, ඊට සහයෝගය දෙන්න සියලු දෙනා එකතු වුණා. ගරු සභාපතිතුමනි, මන් හිතන්නේ අපිට ලබන වර්ෂය වෙනකොට ලොකු අභියෝග රැකට මුහුණ පාන්න සිදු වෙනවා. මොකද අපේ තිබෙන වත්කම් අනුව ලැබෙන ආදායම ඉතාම අඩුයි.

අපි පුනරාවර්තන ආදායම, වියදම ඉලක්කම් පෙළකට සකස් කරාට ,ඒවා සපායා ගැනීමේදී ලොකු ගැටලුවකට මුහුණපාන්න සිදු වෙනවා. ඒවාට වැඩිපුරම මුහුණ දෙන්න වෙන්නේ ඔබතුමාට වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටයි . ඒනිසා නව උත්පාදන ආයෝජනය කරලා සභාවට ආදායම් එන ක්‍රමවේද සකස් කර ගත යුතුයි. එදා මුදල් කමිටුවේදී, අපිට ආදායම් එන්නේ මොන විදිහකටද , ඒ තුළ තව වෙනස් කරන්න තියෙන්නේ මොනවාද කියලා අපි සාකච්ඡා කරා. අපේ බල ප්‍රදේශයට අනුව අපිට ලැබෙන වරිපනම් ප්‍රමාණය ඉතාම අඩුයි. අපි මේ ප්‍රමාණය පුළුල් කළොත් අපිට ඒවාට සේවා සපයන්න අපහසුයි. ඒවාගේ ගැටලු ප්‍රමාණයක් තියනව. හැබැයි ඔබතුමාට පුළුවන් ආණ්ඩුවේ සහ මධ්‍යම රජයේ සහයෝගය අරගෙන තව ටිකක් දුරට අපේ නගර සීමාව පුළුල් කරලා ඒකෙන් තවත් ආදායමක් උත්පාදනය කරලා ජනතාවට යම්කිසි සහනයක් සැලසෙන විදිහට කටයුතු කරන්න ඔබතුමාට පුළුවන් නම් හොඳයි. මන් හිතන්නේ ඒක අපිට ඉදිරි කාලය තුල සකස් කරගන්න පුළුවන් වෙයි. ඒවාගේම අපි යෝජනා කරලා අදහස් කරන් ඉන්න විදිහට, වළකුඹුර ප්‍රදේශයේ අදාල ස්ථානයේ, කපුවරල ඒ ඉඩම් කොටස අරගෙන සභාව වෙනුවෙන් යම්කිසි ආදායම් උත්පාදන වැඩ පිළිවෙලක් සකස් කළොත් අපේ මේ සභාවට ලොකු ආදායමක් ලැබෙනවා. නැත්නම් අපිට හැමදාමත් දුප්පත් විදිහට තමා සභාව ගෙනියන්න වෙන්නේ. අපි දන්න ප්‍රාදේශීය සභාවලින් බහුතරයක් මීට වැඩිය සුවපහසුවට තිබෙනවා. සභාවක් විදිහට අලව්ව ප්‍රාදේශීය සභාව පහළ මට්ටමක ඉන්නේ. ඔබතුමාලගේ සංකල්පය අනුව, සැමට සමානාත්මතාවය යටතේ ඒකේ ගැටලුවක් නැහැ. ඒ උනාට ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපේ මහජන නියෝජිතයින්ගේ ගරුත්වය සම්බන්ධයෙන් පොඩි ගැටලුවක් තියනවා. එම ගරුත්වය ලැබෙන්න ඒ ආයතනයෙන් ඊට ගැලපෙන සුදුසු පරිසරයක් තියෙන්න ඕනි. ඒ පරිසරය අපේ සභාව තුළ නැහැ. ඒනිසා ඔබතුමාට හැකියාවක් තියනවා නම් ඔබතුමාගේ බලය ලැබිලා තියන වසර හතරක වගේ කාලය තුළ මේ සභාවට අලුත් එළියක් ගන්න කටයුතු කරන්න. ඒ සඳහා ප්‍රාද්ශිය සභාවක විපක්ෂ කණ්ඩායම හැටියට අලව්ව ප්‍රාදේශීය සභාව සහ අලව්ව බල ප්‍රදේශය කියන තැන ඉඳගෙන අපේ සහයෝගය ලබා දෙනවා. ඒ නිසා ඒ වෙනුවෙන් පූර්ණ කැපවීම ඉටු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ අනුව මේ මන්ත්‍රීවරුන්ට ගරුත්වයකින් යුතුව අලුත් ප්‍රාදේශීය සභාවකට යන්න අවස්ථාව උදා කරලා දෙන්න හැකියා ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම අද දින මේ අයවැයෙන් යම්කිසි සුළු මුදලක් හරි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට වෙන් කිරීම පිළිබඳව ගරු සභාපතිතුමාටත්, ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයටත් ස්තූතිය පුද කරමින්, ලබන වසරේ ඊට වැඩිය යහපත් තත්වයෙන් මේ අයවැය ඉදිරිපත් කරලා මීට වඩා මුදල් ප්‍රමාණයක් පෙන්නන්න සහ බල ප්‍රදේශයේ ජනතාවගේ උපතේ සිට මරණය දක්වා සිදු කරන කටයුතුවලදී අපිට උපරිමයෙන් මැදිහත් වෙන්න පුළුවන් තත්වයක් මේ සභාවට උදා වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සන්තෝෂ වෙනවා මේ අයවැය සම්බන්ධයෙන් කියන්න බැරි තරම් ප්‍රශ්නයක් නැහැ ඒ නිසා සාමාන්‍ය හොඳ අයවැයක් කියලා අපිට කියන්න පුළුවන්. අපි ඒකාබද්ධ විපක්ෂයේ කැඳවුම්කරු හැටියට මට ඉතාම සන්තෝසයි. අපේ මන්ත්‍රීවරු ඔක්කොම එකම තීන්දුවක ඉදලා, අපි තීන්දුවක් අරගෙන තියනවා අයවැයට සහයෝගය දෙනවා කියලා. විශේෂයෙන්ම ගරු සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලය ඉතාම හොඳ අයවැයක් සකස් කර, ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. නමුත් ආදායම් පැත්ත මදි ඒ නිසා ආදායම් ප්‍රවර්ධනය කරගන්න ඕනි. යත්තල්ගොඩ මන්ත්‍රීතුමා කීවා වගේ අපි දුප්පත් සභාවක්. ඇමරිකාවේ ධවල මන්දිරය ගත්තහම ඉතාමත් ප්‍රතාපවත්, රුසියාවේත් එහෙමයි. යත්තල්ගොඩ මන්ත්‍රීතුමා කීවා වගේ සභාවක ශක්තිමත් බවක් සහ පෞඩත්වයක් තියෙන්න ඕනි. ඒ පරිසරය නිර්මාණය කරගන්න අපි පහුගිය ආණ්ඩුවලිනුත් උත්සාහ කරාට කරගන්න බැරි වුණා. මට මතකයි බැසිල් රාජපක්ෂ මැතිතුමා ආපු වෙලාවක අපි ගොඩනැගිල්ල ඉදි කිරීම ගැන කීවාහම දොස් කීවා මේකේ ඇන්ටික් ගතිය තියාගන්න කඩන්න එපා කීවා. ඒ වෙලාවේ මුදල් වෙන් කරා නම් අපිට හොඳ සභාවක් බිහි කරගන්න තිබුණා. මේ ගොඩනැගිල්ලත් ෂුවර් නැති ගොඩනැගිල්ලක්. අපේ බල ප්‍රදේශයට වැඩක් කරන අපිට හොඳ ආදරයකුත් එක්ක කොන්ද තියාගෙන වැඩ කරන්න පුළුවන් පසුබිමක් තමා සභාපතිතුමා ඇතළු මේ මන්ත්‍රීවරු 26 දෙනාටම ඕනි. අපේ සභාවත් නාරම්මල, වාරියපොල ,පඩුවස්නුවර සභා වගේ ඒ මට්ටමට දියුණු වෙනවානම් කැමතියි. අපේ සභාව කියලා අභිමානෙන් කියාගන්න පුළුවන් තැනක් නිර්මාණය කර ගන්න ඕනි. ඔබතුමාගේ ශක්තියත් සමඟ ඔබතුමාලාගේ පාර්ලිමේන්තු මන්ත්‍රිතුමාගේ සහයෝගයත් අරගෙන පුළුවන් නම් මේ ගොඩගැල්ල හදන්න මුදල් ටිකක් හොයා ගන්න. ඒකට අපි හදවතින්ම සුභ ප්‍රාර්ථනා කරනවා. අපි මේකේදී හදවතින්ම සුභ පතනවා වගේම අපේ 13 දෙනාට අසාධාරණයක් වුණොත් අපි භය නැතුව නැගි සටිනවා.

අපි සාධාරණ පැත්තේ හිටගන්නවා. අසාධාරණයට එරෙහි වෙනවා. ඇත්තටම හොඳ දේශපාලන සංස්කෘතියක් තියනවා. ඔබතුමා ඇතුළු ඔබතුමාගේ ආණ්ඩු පක්ෂයේ අයත් සහයෝගය දෙන්න ඇති කියලා මම විශ්වාස කරනවා. විපක්ෂයටත් මුදලක් වෙන් කරලා තියනවා අපි හදවතින්ම ඒකට ස්තූතිවන්ත වෙනවා. අපි හොඳ දේ අගය කරනවා කුහක වෙන් නැහැ. අපේ පක්ෂවල සහ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන සංස්කෘතිය වෙනස්. ඒත් මුදලක් වෙන්කිරීම නිසා හදවතින්ම ස්තූතිවන්ත වෙන්න ඕනි. මගේ නම් ප්‍රාර්ථනය මේ රට දියුණු වෙන්න ඕනි අපි කවුරුත් කොහොම දේශපාලනය කරත් මේ රටේ අපි කාටත් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය වෙන්න ඕනි. අපි කවුරුත් බොහෝම අමාරු ආර්ථික මට්ටමක යන්නේ. ඉතිහාසයේ ඉඳලා ආපු ප්‍රශ්නයක පොඩි ප්‍රතිඵලයක්. ඔබටත්, මටත්, රටේ පුරවැසියන්ටත් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් බොහොම හොඳ පරිසරයක් හදන්න තමා අපිට ඕනි. මම දන් නැහැ මේකේ ආදායම් තත්වය මත හැකියාව තියේද කියලා, අපිට වෙන් කරලා තියන ලක්ෂ තුන හමාරට වඩා මුදලක් ලක්ෂ පහක් පමණ මන්ත්‍රීවරුන්ට වෙන් කරන්න කියලා ඉල්ලීමක් කරනවා හැකි නම් ඒ වෙන් කිරීම කරන්න. පොදුවේ අපි 26 දෙනාටම තව ලක්ෂ එක හමාරක් වැඩි කරලා දෙන්න පුළුවන් නම් ඒක ලොකු දෙයක් හැටියට දකිනවා. හැම මන්ත්‍රීවරයෙකුගේම කොට්ඨාසයක ග්‍රාම නිලධාරී වසම් පහක් විතර තියනවා කොහොම හරි ශ්‍රමදානයක්වත් දාල හොඳ වැඩක් කරන්න ඕනි. ඒ දෙන මුදල් ටිකෙන් හොඳ ආදර්ශයක් පෙන්වන්න ඕනි ඒක තමා අපේ යුතුකම. එතකොට තමා ඊළඟ අවුරුද්දේ ආණ්ඩු පක්ෂයටත් විපක්ෂයටත් අපි කාටත් ලොකු මුදලක් ගන්න අවස්ථාව හැදෙන්නේ. මේ අයවැයෙන් අපි සියලු දෙනාටම වැඩක් කරන්න අවස්ථාව ලැබිලා තියනවා. ආදායම වර්ධනය කර ගන්න ඕනි. මම යෝජනාවක් කරනවා මේ දවස්වල නියෝජ්‍ය ඇමති සනත් මැතිතුමාත් හොඳ වැසිකිළි හදන්න ඕනි කියලා තිබුණා. අපි කොළඹ ඉඳලා එද්දී කවුරුත් අපිරිසිදු වැසිකිළියකට ගොඩ වෙන්න කැමති නැහැ. කොළඹ ඉඳලා අලව්ව හරහා කොච්චර මිනිස්සු යනවාද පුළුවන් නම් ලොකු මුදලක් අය කළත් කමක් නැහැ හොඳ පිරිසිදු සනීපාරක්ෂක පද්ධතියක් හදන්න ඕනි. ඒක එක පැත්තකින් ලොකු සේවයක්. විදේශිකයන්ට දුන්නොත් එයාලාගෙන් ඊට වැඩි මුදලක් ගන්න පුළුවන්. මගේ පෞද්ගලික අදහස ව්‍යාපාරික මට්ටමකින් හදලා මුදලක් අය කරගන්න පුළුවන්. තව තවත් මේ සභාවේ ආදායම් වර්ධනය කර ගන්න අලව්ව නගරයේ ගොඩනැගිලි එකක් දෙකක් හදා ගත්තොත් ,බෝයවලාන, මහරච්චිමුල්ල නගරවල ගොඩනැගිලි ටිකක් හදාගත්තොත් අපිට ආදායම් මාර්ග ගොඩ නගා ගන්න පුළුවන්. සභාපතිතුමා ඉදිරිපත් කරපු අයවැය ගැන අපේ විපක්ෂයේ සමස්ථයේම කිසිම ආරවුලක් නැහැ අපේ සහයෝගය දෙනවා. අතුකොරාල මන්ත්‍රීතුමා පුද්ගලික කටයුත්තකට ගියත් එතුමා ඇතුළු අපි දහතුන්දෙනාම හදවතින්ම සහයෝගය දෙනවා. හැබැයි සභාපතිතුමා අසාධාරණකම් කරන්න එපා. අපේ මන්ත්‍රීවරුන්ටත් හැමවෙලාවේම අවංකව උදව් කරන්න. සභාපතිතුමා හැකි අයුරින් උදව් කරලා තියනවා ඒවාටත් අපි ස්තූතිවන්ත වෙනවා. කොට්ඨාසයේ වැඩකට ගියොත් විපක්ෂයේ මන්ත්‍රීවරු කියලා කොන් කරන්න එපා. එයාලත් සම්බන්ධ කරගෙන පුළුවන් විදිහට සහයෝගය දෙන්න අවස්ථාව ලබා දෙන්න. අපිත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ආශ්‍රය කරනවා. අතිමහත් බහුතරය මනුෂ්‍යත්වය තියන මන්ත්‍රීවරු. අල්ලපු කොට්ඨාස දෙක ගත්තහම මීගාර මන්ත්‍රීතුමයි උද්ධාල මන්ත්‍රීතුමයි සමඟින් අපි බොහොම මිත්‍රශීලීව කටයුතු කරනව. ඔවුන්ගේ වැඩවලට කතා කරාම යන්න බැරි වුණත් හදවතින්ම සුභ පතනවා. විශේෂයෙන්ම නුංගමුව ප්‍රදේශයට ගිහාම අකිල මන්ත්‍රීතුමා ඉන්නවා අපි පොඩි කාලයේ ඉඳලා දන්නවා හොඳ සහෝදරයෝ වගේ. අනිත් සියලුම මන්ත්‍රීවරුත් ඉතාම හොඳ අය. ඉතින් හොඳ අයවැයක් හැදීම සම්බන්ධයෙන් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට නැවතත් ස්තූතිවන්ත වෙනවා. අපේ සභාවේ ඉතාම ලෙන්ගතු නිලධාරීන් පිරිසක් ඉන්නේ. අපේ සභාවේ උඩ ඉඳලා බිමටම සේවකයෝ ගත්තහම හොඳ මිනිස්සු ඉන්නේ. සීයක් ගත්තොත් සියලු දෙනාම මට නම් හොඳයි. හොඳ මානුෂිකත්වයක් තියන නිලධාරී කණ්ඩායමක් ඉන්නේ. අපේ කාර්ය මණ්ඩලයටත් අයවැයෙන් අපි උදව් කරන්න ඕනි. අපේ බල ප්‍රදේශයට සහ අපේ වැඩවලට උදව් කරනවට එම නිලධාරීන්ගේ සුභ සාධනය සහ හැම පැත්තෙන්ම එයාලටත් ලොකු සහයෝගයක් දෙන්න ඕනි. මේ අයවැයට විපක්ෂයේ සියලු දෙනාගේම සහයෝගයත් හිමි වෙනවා. ඒ වගේම අනාගතයේදී කරන වැඩවලදී මෝටර් ග්‍රේඩරය ලබා ගැනීමේදී, වීථි ලාම්පු සවි කිරීමේදී යන හැම කටයුත්තකදීම අපේ විපක්ෂයේ හැම කෙනාටමත් ගරු සභාපතිතුමා අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, ඔබ සැමට ජය වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනාවා. බොහෝම ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, බෙහෝම කාලෙකින් කිසිම ප්‍රශ්නයක් නැතුව අයවැය සම්මත වෙන දවසක්. මම සතුටු වෙනවා ඒ ගැන .

මම 2010 ඉඳලා ප්‍රාදේශීය සභාවේ කටයුතු කළා අපි බොහෝ අවස්ථාවල අයවැය සම්මත කරනකොට බොහෝ ගැටලුකාරී තත්වයක් මතු කරා. සමහර ඒවා අරගල බවට පත් වුණා. ඒකාබද්ධ විපක්ෂයක් හැටියට අපි එකතු වෙලා අයවැය සම්මත කිරීමට ගත් තීරණය ගැන අද සතුටු වෙනවා. කිසිම දවසක අපි අයවැය ගැන කතා කරලා නැහැ. විරුද්ධ වෙන්න අදහසක් තිබුණෙත් නැහැ. විපක්ෂය කියලා හැමදේකටම විරුද්ධ වෙන සම්ප්‍රදායක් නැහැ. ඒ දවස්වල සභාපතිවරුන්ගේ යම් යම් වැරදි ක්‍රියා නිසා අපි විරුද්ධ වුණා. ඉස්සර සභාපතිවරුන්ටත් ඉහළින් පාලනය කරන පිරිස් මෙතන හිටියා. එයාලගේ උපදෙස් මත තමා හිටපු සභාපතිවරු කටයුතු කළේ. හිටපු සන්ධ්‍යා සභාපතිතුමාව වෙන අය පාලනය කරේ හොඳ දේවල්වලට නෙවේ. ඒ සිද්ධි නිසා තමා අපි එදා විරුද්ධ වුණේ. ඉතින් ඒ කාලයේ සභාපති තනතුරේ ඉඳලා ඔවුන්ගේ කීර්ති නාමයටත් හානියක් සිදු කරගත්තා කියලා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. අපි සතුටු වෙනවා ඇත්තටම හොඳ අයවැයක් හදලා තියනවා. නමුත් හොඳ අයවැයක් හැදුවත් විරුද්ධ වෙනවා නම් විරුද්ධ වෙනවා. අපිටත්, අලව්ව ප්‍රදේශයේ ජනතාවටත් සහයෝගය දීලා සභාපතිවරයා හරියට කටයුතු කරනවා නම් මහජන නියෝජිතයෝ හැටියට අපි ඒක තමා බලාපොරොත්තු වෙන්නේ. හය වෙනි මාසයේ අපි පත් වුණේ ඉතින් මෙතෙක් කල් අපිට සභාපතිතුමා අතින් ඒ දේ සිදු වෙනවා කියලා පේනවා. ඒ නිසා අයවැයට විරුද්ධ වෙන්න හේතුවක් නැහැ. අපි කූඩුවක් වගේ කාලයක් හිරවෙලා හිටියා, ඊට පස්සේ කාලයක් නගර ශාලාවේ හිටියා දැන් නැවත පරණ සභා ගොඩනැගිල්ලේ ඉන්නවා. රටේ අනිකුත් සභා සුඛෝපභෝගී විදිහට තියෙන්නේ. ඉතින් ඒ විදිහට අපි ඉන්න මේ අවුරුදු හතරේ ඇතුළත ඔබතුමාට කරගන්න පුළුවන් අවස්ථාවක් තියේ නම් අපේ සම්පූර්ණ සහයෝගය අපි දෙනවා. කතාවක් තියනවානේ අවුරුදු 76කට පස්සේ මාලිමාව බලයට ආවේ කියලා ඒ අයත් ඔලුව ඉදිමවා ගන්න හොඳ නැහැ අපිටත් හැමදාම බලයේ ඉන්න පුළුවන් කියලා මුහුණු පොතේ දානවනේ අපිට කාලයක් ඉන්න පුළුවන් අවුරුදු 10ක් 20ක් 30ක් අපි ඉන්නවා කියලා තමුන්නාසේලාත් මේ අවුරුදු 4,5 ඉන්නකොට අනිත් පැත්ත පෙරලෙන්න පුළුවන්. ඒ නිසා ඒවත් ඔළුවේ තියාගෙන කටයුතු කරන්න. මිනිස්සුන්ට නිහතමානී වෙලා මේ ප්‍රදේශයේ ජනතාව සහ අපිත් එක්ක අත්වැල් බැඳගෙන කටයුතු කරන්න අවස්ථාවක් ලැබිලා තියනවා. මේ ප්‍රාදේශීය සභාව මාලිමා රජයෙන් හොඳට ලස්සනට ගොඩ නැගුවා කියලා අපේ ඊර්ෂ්‍යාවක් කුහකකමක් නැහැ. අපේ සහයෝගය දෙනවා. ඒ නිසා ඔබතුමාට ප්‍රාර්ථනා කරනවා මේ ප්‍රාදේශීය සභාවට ප්‍රදේශයේ ජනතාවට වැඩක් කරමින් මන්ත්‍රීවරු හැටියට අපේ ගරුත්වයත් ආරක්ෂා කරලා කටයුතු කරන්න ලැබේවා කියලා. අපිට ප්‍රතිපාදන ලෙස ලක්ෂ තුන හමාරක් තාමා ලැබෙන්නේ ඒ ප්‍රමාණයත් මට නම් ඇති. ඔබතුමාට මතක ඇති ඒ කාලේ තමුන්නාන්සේ මොනවත් ඉල්ලන්නෙත් නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, අරගලයේ ප්‍රතිඵලයක් විදිහට අවසාන අවුරුදු දෙකේ හම්බ වුණා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ඔව් ගරු සභාපතිතුමනි, අපි ඒ අරගලවල මූලිකත්වය අරගෙන කටයුතු කළේ. මේ වෙලාවේ අග්බෝවේ නන්දසේන හිටපු මන්ත්‍රීතුමා මතක් කරන්න ඕනි. අපේ අරගලවලට අපිත් එක්ක එකට හිටගත්තු පුද්ගලයෝ. නැවතත් මම මතක් කරන්නේ තමුන්නාන්සේලාට මේ ප්‍රදේශය දියුණු කරන්න ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ ජාතික ජන බලවේගයේ පළමු මංගල අයවැය ඉදිරිපත් කෙරුවා. නවක මන්ත්‍රීවරු හැටියට අයවැය විවාදයට කතා කරන පළමු අවස්ථාව මෙයයි. ඇත්තටම ගරු සභාපතිතුමනි, අපි ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කරලා 159 කින් යුතු ආණ්ඩුවක් නිර්මාණය කරලා ලංකාවේ බහුතර ප්‍රාදේශීය සභා ප්‍රමාණයක බලය අරගෙන අපි උත්සාහ කරන්නේ මේ රට තිබෙන තත්වයෙන් යම්කිසි මට්ටමකට නගා සිටුවන්න. අපේ අවශ්‍යතාවය අනාගත දරු පරපුර වෙනුවෙන් හොඳ රටක් නිර්මාණය කරන්න. මන් හිතන්නේ ඒවාගේ පෙරමං ලකුණු සුභ ලකුණු ජනතාව තුළින් දකින්ට ලැබෙනවා. හේතුව අද රටේ සිදුවන දේවල් බැලුවහම රජයක් විදිහට හොඳ රටක් විදිහට ස්ථාවර මට්ටමකට ඇවිත් තියනවා. ආර්ථික වශයෙනුත් මත්ද්‍රව්‍ය මර්දනය කිරීම පැත්තෙනුත් රටක් විදිහට ඉදිරියට ඇවිල්ලා තියනවා. මධ්‍යම රජය මේ විදිහට රට වෙනුවෙන් ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු සිදු කරද්දී, අලව්ව බල ප්‍රදේශයේ ජනතාව එහෙම නැත්තනම් මැතිවරණ කොට්ඨාස 15ක ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් ප්‍රාදේශීය සභාවක් විදිහට ගතයුතු තීන්දු තීරණ සහ වැඩ කළ යුතු ආකාරය සියල්ලම ඇතුළත්ව තමා මේ අයවැය ගරු සභාපතිතුමා විසින් ලේකම්තුමිය සහ කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව ඉදිරිපත් කරලා තියෙන්නේ.

මේ අයවැය පිළිබඳව පෙර ප්‍රකාශ කළ අදහස් ආකාරයට අයවැයේ කිසිම අඩුපාඩුවක් අපි දකින් නැහැ. අපි ලංකාවේ තිබෙන අඩු ආදායම් ලබන ප්‍රාදේශීය සභා අතරින් එකක්. ඒක අපිට දකින්නට ලැබෙනවා හේතුව අපි නාරම්මල සභාවට ගිහාම ඒ පරිශ්‍රය ගත්තහම අලව්ව ප්‍රාදේශීය සභාවට පස්සේ තමා නාරම්මල සභාව බිහි වෙන්නේ. ඊට පස්සේ පොල්ගහවෙල වාරියපොල මේ සභා සියල්ලම මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය රැකෙන ආකාරයට මන්ත්‍රීවරයෙක් ලෙස ආඩම්බරයෙන් කටයුතු කිරීමට හැකි අයුරින් සභා ගර්භය නිර්මාණය වෙලා තියනවා. හැබැයි අලව්ව ප්‍රාදේශීය සභාව මන් හිතන්නේ දීර්ඝ කාලයක් තිස්සේ පැවති සභාවක් ආදායම් අතින් දුප්පත් සභාවක්, අදටත් දුප්පත් ආකාරයට තමා සභාව පවත්වාගෙන යන්නේ. හැබැයි මම මේකේ කිසිම කෙනෙකුට චෝදනා කරන් නැහැ. මේ තත්වයට පත්වෙන්න යම්කිසි හේතුවක් තියනවා. ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන් නැහැ .නමුත් අවංකව අපිට වෙන්න ඇත්තේ මොකක්ද කියන එක දන්නවා. යත්තල්ගොඩ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ මනුස්සයෙකුගේ උපතේ සිට මරණය දක්වා අවශ්‍ය සියලුම සේවාවන් ප්‍රාදේශීය සභාව තුළින් සපයනවා. ඒත් එම සේවාවන් සභාව තුළින් නිසි ආකාරව ඉෂ්ට කරලා දෙන්න නම් මේ ප්‍රාදේශීය සභාව වැඩි ආදායම් ලබන සභාවක් බවට නිර්මාණය කළ යුතුයි. මන් හිතනවා 2025 වර්ෂයේ නිර්මාණය කරන ලද මෙම ප්‍රාදේශීය සභාවේ මූලික අභියෝගය බවට පත්වෙලා තියෙන්නේ වැඩි ආදායම් ලබන ප්‍රාදේශීය සභාවක් බවට නිර්මාණය කිරීමයි. ඒ නිසා තමා ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රි මණ්ඩලයේ සහ රාජ්‍ය නිලධාරීන්ගේත් මූලික වගකීම වෙලා තියෙන්නේ. එසේ අපි වැඩි ආදායම් ලබන ආයතනයක් බවට පත් කළොත් තමා මිනිසුන්ගේ උපතේ සිට මරණය දක්වා බලාපොරොත්තු වෙන සියලුම සේවාවන් ලබා දෙන්න පුළුවන් වෙන්නේ. එහෙම නම් අපේ වගකීම තමා වැඩි ආදායම් ලබන ප්‍රාදේශීය සභාවක් බවට පත් කිරීම සඳහා යෝජනා කළ යුත්තේ මොනවාද ක්‍රියාත්මකක කළ යුත්තේ මොනවද කියලා සොයා බලන එක. ඒ සඳහා අපි සියලුදෙනාම කැප වෙමු කියලා ඉල්ලීමත් මේ අවස්ථාවේදී කරනවා. ඒවගේම ජනතාවට සේවය කරන්න නම් රාජ්‍ය ආයතන සමඟ නිවැරදි සම්බන්ධීකරණයක් ගොඩ නගා ගත යුතුයි. මම දකින ප්‍රධාන දුර්වලතාවයක් තමා රට තුළ තිබෙන රාජ්‍ය ආයතන සමඟ නිවැරදි සම්බන්ධීකරණයක් නොමැතිකම. රාජ්‍ය ආයතන අතර අසමගිකමක් තියෙන්නේ. ඒ තුළින් යහපත් රටක් නිර්මාණය කරන්නත්, ජනතාවට හොඳ සේවයක් සපයන්නත් ලැබෙන් නැහැ . ගරු සභාපතිතුමාට අභියෝගයක් තියනවා මන් හිතන්නේ අපේ මේ ප්‍රදේශයේ රාජ්‍ය ආයතන නිවැරදිව එක ස්ථාවරයකට ගේන්න. ඒ ආයතන අතර සම්බන්ධතාවය ඇති කරන්න ඔබතුමාට ලොකු වගකීමක් තියනවා. ඒ වගකීම ඔබතුමා ඉෂ්ට කරයි කියලා හිතනවා. එහෙම නැති වුණොත් අපි බලාපොරොත්තු වෙන නිවැරදි ගමන් මාර්ගයකට යන්න අවස්ථාව ලැබෙන් නැහැ. ඒ නිසා අපි රාජ්‍ය ආයතන අතර සම්බන්ධතාවය ශක්තිමත් කර ගත යුතුයි. ඒ වගේම ගරු සභාපතිතුමනි, සමස්ත ජනතාවගේම නියෝජිතයා විදිහට ප්‍රාදේශීය සභාවක මහජන නියෝජිතයා සහභාගි වෙලා ජනතාවගේ ප්‍රශ්න අරන් මෙතෙන්ට පැමිණෙන්නේ. ඒ නිසා ඒ සභිකයාට යම්කිසි ගරුත්වයක් මේ සභාව තුළ දිය යුතුයි. ඒ පරිපාලනය තුළ යම් යම් අඩුපාඩු දුර්වලතා මම දකිනවා. මන් හිතනවා ඔබතුමා ඒවා මේ වෙනකොට හඳුනාගෙන ඇති කියලා. ඒ දේවලුත් නිවැරදි කළ යුතුයි. මහජන නියෝජිතයන් සහ සමස්ත රාජ්‍ය නිලධාරීන් යම්කිසි වැටුපක් ලබනවා. ඒ වැටුපේ නිර්මාණකරුවෝ තමා අපිව මෙතෙන්නට එවලා තියෙන්නේ. ඔවුන්ගේ බදු ආදායම්වලින් තමා අපි යැපෙන්නේ. ඒ නිසා ඔවුන්ටත් නියමිත ගරුත්වයක් හිමිවිය යුතුයි කියලා ප්‍රකාශ කර සිටිනවා. මේ අයවැයේ සමානාත්මතාවය කියන එක දක්නට ලැබෙනවා. ඒ තුළ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා තියනවා. ඔබතුමාලා හොයලා බලන්න මන් හිතන් නැහැ අනිකුත් ප්‍රාදේශීය සභාවවල මේ තත්වය ඇති කියලා. ඒකේදී ආණ්ඩු පක්ෂය විදිහටත් ගරු සභාපතිතුමාට කිසිම අවස්ථාවක විරෝධයක් ඉදිරිපත් කළේ නැහැ. අපි සියලු දෙනාම සහයෝගීත්වයෙන් මේ ගමන යා යුතුයි. අපි සියලු දෙනාගේම එකම අභිප්‍රාය වන්නේ, මේ ප්‍රදේශයේ ජනතාවට සේවය කිරීමයි. ඒකෙදී අපි ප්‍රතිපාදන බෙදී ගිය ආකාරය වාද විවාද කරලා විපක්ෂයට අඩු වෙන් යන්න ඕනි අපිට වැඩියෙන් ප්‍රතිපාදන එන්න ඕනි කියලා කිසිම අවස්ථාවක සභාපතිතුමත් එක්ක සට්ටනයක් ඇති කරගත්තේ නැහැ. අපි සභාපතිතුමත් එක්ක කතා කළේ අපිට සභාව නිවැරදිව ගෙනියන්න ඕනි බල ප්‍රදේශයේ ජනතාවට සිදු විය යුතු සේවාව නිවැරදිව ලබා දිය යුතුයි, මේ මන්ත්‍රීවරු 26 දෙනාගේම සහයෝගය සහභාගීත්වය ලබා ගත යුතුයි කියලා. ඔවුන්ගේ සහයෝගයත් සමඟ තමා ඉදිරියේදී සැලසුම් කරලා තියන සියලුම වැඩ කරගෙන යාමට හැකියාව ලැබෙන්නේ. සභා ගොඩනැගිල්ල, ආදාහනාගාර ඉදි කිරීම වැනි මේ සියල්ලටම සභා ගර්භය තුළ තීන්දු තීරණ ගත යුතුයි. ඔවුන් සියලු දෙනාගේම සහයෝගය ලබා ගත යුතුයි. අපි ඉතා සාමකාමීව මේ ගමන යායුතුයි කියන මතයේ තමා සෑම අවස්ථාවකම අපි ඉන්නේ.

නාරද මන්ත්‍රීතුමා කීවා අයවැයක් සම්මත වෙද්දී විශාල කාලගෝට්යක් ඇති වෙනවා කියලා මෙම අයවැය සම්මත කිරීමේදී කිසිම ගැටලුවක් ඇති නොවී සතුටින් යුතුව මේ අයවැය සම්මත කර ගැනීමට හැකි වීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඉදිරි වසරවලදීත් මේ වගේම කටයුතු කරමු. අපේ අරමුණ තියෙන්නේ මහජනතාවට සේවය කිරීම නම් අපි සියලු දෙනා එකට එක්විය යුතුයි කියන මතයක මා සිටිනවා. අඩු ආදායම් ලබන ආයතනයක් විදිහට අපිට ලොකු අයවැයකට යන්න බැහැ. ලොකු ප්‍රතිපාදන ලබා දීමකට යන්න බැහැ. වැඩි ආදායම් ලබන සභාවක් විදිහට, අපි නිර්මාණය කර ගත යුතුයි. ඒවගේ ගරු සභාපතිතුමනි, ඔබතුමාට ලොකු වගකීමක් තියනවා. මධ්‍යම රජය මඟින් අත්‍යාවශ්‍ය ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා මැදිහත් වීම සිදු කරන්න. ඒ අනුව අලව්ව පුරවරය සොඳුරු පුරවරයක් ලෙස නිර්මාණය කිරීමට අපි සියලු දෙනාම කටයුතු කරමුයි කියා ඉල්ලා සිටිමින් අයවැය සකස් කිරීමට දායකත්වය ලබා දුන් ගරු සභාපතිතුමාටත්. ලේකම්තුමිය ඇතුළු රාජ්‍ය නිලධාරීන්ටත් ස්තූතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මටත් ලොකු සන්තෝසයක් තියනවා. ඉතිහාසයත් සමඟ බැඳුණු කතාවක් ඒ නිසා මේක මා කිය යුතුයි. අද මගේ සභාපතිවරයා ලෙස මගේ හිතවත් සහෝදරයෙක් පත් වුණේ.

ඔහු සහ මම ගමේ එක ගෙවල් ළඟ හැදුනේ වැඩුනේ. අද මම දේශපාලනයට අත්පොත තියන්නේ අජිත් පරණගමගේ කියන සහෝදරයාත් සමඟයි. අපි දෙදෙනාට දේශපාලනයත් සමඟ දීර්ඝ ඉතිහාසයක් තියනවා. ඉතිහාසයේ ජීවත් වුණු කාලය පිහිබඳව මම සතුටු වෙනවා. මාත් සමඟ ඉද්දී අජිත් පරණගමගේ සහෝදරයා 88/89 දේශපාලන භීෂණ කාලයේ පැහැර ගන්නවා. එතකොට මට අවුරුද 16යි. එතුමා කියලා දුන්නු දේශපාලනය ඇතුළේ අපි කොහොමද සමානාත්මතාවයෙන් සලකන්නේ මේ රට ගෙනියන්නේ කොහොමද කියලා ඒ අසාධාරණකම් දැකලා ඒ කියලා දීපු දේවල් කවදා හෝ දවසක හීනේ හැබෑ වෙයි කියලා අපේ බලාපොරාත්තුවක් තිබුණා. එදා අජිත් සහෝදරයා ඇතුළු කණ්ඩායම එකතු වෙලා ප්‍රියන්ත මන්ත්‍රී සහෝදරයා කීවා වගේ රටේ සභාවවල අපේ දේශපාලන නායකයෝ පත් කර ගත්තා. ඒ එකම තැනකවත් අපි බලාපොරොත්තු වුණු අභිප්‍රාය ඉෂ්ට වෙලා නැහැ. හැබැයි අනිත් මන්ත්‍රීවරු හැමෝටම කියනවා අපි දේශපාලන සංස්කෘතිය වෙනස් කරා. මැතිවරණ තුනක් ඉහළින් ජයග්‍රහණය කරලා කිසිම කෙනෙකුට අබමල් රේණුවකින්වත් හානියක් කරදරයක් නොකර මේ දේශපාලන සංස්කෘතිය අරන් ආපු එකේ එකම සාක්ෂිය තමා මේ ප්‍රකාශයට පත් කළ අයවැය. අපි ගැන කියපු සමහර කතා විපක්ෂය කියපු කතා ඔක්කොම අපි අද බොරුවක් කරලා තියනවා. නමුත් අපි අද මේ ආණ්ඩුවට හයියක් වෙමින් අයවැය තුළින්ම සමානාත්මතාවය ක්‍රියාත්මක කරලා තියෙන්නේ කියලා පෙන්නලා තියනවා. ඔබතුමාලා විපක්ෂයක් විදිහට අපිත් එක්ක එකතු වෙලා අයවැය ගැන සතුටින් කතා කරනවා. ඒකත් අපිට සතුටක්. අපිටත් ඕනි කුමන පක්ෂය නියෝජනය කළත්, අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ එකම මාර්ගයක ගිහින් ජනතාවට සේවයක් කිරීමයි. අපි සභාපතිතුමාට හැම මෙහොතේම කීවේ ආණ්ඩු පක්ෂය හැටියට අපිට ලබා දෙන දේ සමානව ඔවුන්ටත් ලබා දිය යුතුයි කියලා. විශේෂයෙන්ම මේ අයවැය සකස් කිරීම සම්බන්ධව ලේකම්තුමිය ප්‍රධාන නිලධාරී මණ්ඩලයට ස්තූතවන්ත වෙනවා. අයවැය සැකසීම පහසු කාර්යක් නොවේ. වියදමෙහි එක ඉලක්කමක්වත් වැරදිලා තිබුණොත් ඒවාට වගකියන්න ඕනි. නිවැරදිව සිදු කිරීම සම්බන්ධව ස්තූතවන්ත වෙනවා. ගරු සභාපතිතුමා ඔබතුමා කියලා දීපු දේශපාලනය යටතේ ජයග්‍රහණය කිරීමට අත්වැලක් සැපයීමට හැකි වීම පිළිබඳව මට සන්තෝසයක් තියනවා. ඒවගේ මන්ත්‍රීවරු දක්වපු සහයෝගයටත් ස්තූතිවන්ත වෙනවා. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම ම අපි ලබපු ලොකු ජයග්‍රහණයක්. මේ සඳහා සහභාගී වීම සම්බන්ධව සහ අපිට දක්වන සහයෝගයට ගරු මන්ත්‍රීවරුන්ට ස්තූතියි. 2026 වර්ෂයේ අවුරුදු තුනක් හෝ හතරක කාලයක් ඉතිරි වෙලා තියනවා අලව්ව ප්‍රාදේශීය සභාව සභා අතරින් හොඳම ප්‍රාදේශීය සභාව බවට පත් කරන්න ඔබතුමාට වාසනාව ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට සුභාශිංසන එකතු කරනවා. පොඩි කාලයක් තුළ ඔබතුමා ගෙනාපු අයවැය පිළිබඳව සතුටුදායක මතිමතාන්තර ඉදිරිපත් වෙද්දී ඔබතුමාටත් සතුටු ඇති. මන් හිතනවා සාර්ථක අයවැයක් විදිහට විපක්ෂය විරුද්ධයි කියන එක සාම්ප්‍රදායක පිළිවෙලින් බැහැරවෙලා අපි සියල්ලත් මේකට එකඟයි කියන තැනට ඇවිල්ලා තියනවා. මේකේදී සමානාත්මතාවයෙන් සලකලා මන්ත්‍රීවරුන් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබීම පිළිබඳව තමා මම මුලින්ම බැලුවේ. මට සතුටු හිතුණා. මගේ යෝජනාව දෙතුන් සැරයක් දැම්මා මේ අවස්ථාවේ ඒක මල්ඵල ගැන්විලා තියනවා. ඒකට බොහෝම ස්තූතිවන්ත වෙන ගමන්, හැමදෙනාම කීවා වගේ අයවැයේ ආදායම් උත්පාදනය තමා ඉදිරියට අපි බලාපොරොත්තු වෙන්න ඕනි.

වියදම ප්‍රශ්නයක් වෙන් නැහැ නමුත් ආදායම ලොකු ප්‍රශ්නයක් වෙලා තියනවා. ඒවගේම අපි පුංචි කාලයේ ඉඳලා ලංකාව ගැන රචනයක් ලීවා ශ්‍රී ලංකාව ඌණ සංවර්ධිත රටක් කියලා. ඒවගේ හැමදාම අපි මේ සභාවේ කියනවා අලව්ව ප්‍රාදේශීය සභාව දුප්පත් සභාවක් කියලා. ඉතින් ඒ වචනය බැහැර කර ගන්න මේ අයවැයෙන් ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කර ගමන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අපේ සම්පත් බොහොමයක් තියනවා. එළදෙන දෙකට බෙදා ගත්තා වගේ අපිට ඉස්සරහ කොටස දීලා ඒගොල්ලෝ පිටුපස කොටස අරගෙන ප්‍රශ්නය එනකොට අපිට, ප්‍රතිඵලය එනකොට ඒගොල්ලන්ට. කිරිටික ගොම ටික ඔක්කොම එයාලා ගන්නවා හැබැයි ප්‍රශ්න එන්නේ සභාවට. ඒනිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා දැඩි අවධානය යොමු කරලා අපේ සම්පත් අපිට හිමි කරගන්න කටයුතු කරන්න කියන ඉල්ලීමත් මේ වෙලාවේ කරනවා. ඒවගේම අපේ මන්ත්‍රීවරු විපක්ෂය හෝ ආණ්ඩු පක්ෂය ලෙස විවිධ මතිමතාන්තරවලින් පක්ෂ දේශපාලනය කරත්, අවසානයේ අපි මහජන සේවය කියන එකම තීරණයක ඉන්නේ. විවිධ මත ඔස්සේ අන්තිමට එතෙන්ට යන්නේ. ඒනිසා හොඳ අයවැයක් ඉදිරිපත් කරා කියලා හිතනවා ඒක ඒ විදිහටම ක්‍රියාත්මක කරගන්න ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම අපේ කොට්ඨාසයේ ගරු මන්ත්‍රීතුමාට යෝජනාවක් මේ අවස්ථාවේම කරනවා. තුන් ලක්ෂ පනස්දහසක මුදලක් මගේ යෝජනාවට වෙන් කරලා තියනවා එතුමාගේ ඒ යෝජනාවටත් ඒ මුදල වෙන් කරලා තියනවා. එතුමාගේ යෝජනාවට පොඩි මුදලක් යන්නේ. නමුත් මගේ යෝජනාව තුන්ලක්ෂ පනස්දහසෙන් කරන්න අමාරුයි. අපි දෙන්නා වෙනම කතා කරලා හරි ඊට වඩා දුෂ්කර සහ ජනතාවට ප්‍රතිලාභ ලැබෙන තැනකට යොමු කරගන්න කතා කරගමු කියලා මතක් කරනවා. මේ අවස්ථාවේ ඔබතුමාගේ අයවැයට සුභාශිංසන එක් කරන ගමන් මෙය සාර්ථකව කරගෙන යාමට ලේකම් තුමිය ඇතුළු රාජ්‍ය නිලධාරී ඔබ සියලු දෙනාගේ සහ පක්ෂ විපක්ෂ අපි සියලු දෙනාගේම සහයෝගය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහෝම ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අද සියලු දෙනාටම සතුටු දවසක්. අද සභාපතිතුමාගේ මංගල අයවැය ඉදිරිපත් කරා. නවක මන්ත්‍රීවරු විදිහට අපිටත් නැවුම් අත්දැකීමක් මෙච්චර ලස්සන අයවැයක් ගැටලු නැතිව සම්මත කරගැනීමට ලැබීම ගැන ඔබතුමා ඇතුළු අපි සියලු දෙනාම ලද භාග්‍යයක්. ඒ නිසා ගැටලු ඇති නොවන අයවැයක් නිර්මාණය කරදීම සම්බන්ධව ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට බොහෝම ස්තුතිවන්ත වෙනවා. අපේ මේ සහෝදර මන්ත්‍රීවරු සියලු දෙනාම බලාපොරොත්තු වන දේ, මේ මුදලෙන් කරන්න බැහැ කියලා ඇත්තටම අපි දන්නවා. ඒත් ඔබට තියන දේ තාත්තා දරුවෝ ටිකට බෙදලා දුන්නා වගේ පුළුවන් විදිහට බෙදලා දුන්නා. ලබන වර්ෂයේ පූර්ණ අවධානය යොමු කරලා අපි සියලු දෙනාගේම ශක්තිය අරගෙන ප්‍රාදේශීය සභාව ගොඩ නගමු. එතකොට ලබන අවුරුද්දේ මන්ත්‍රීවරු හැටියට හොඳ වැඩ කොටසක් කරන්න පුළුවන් වෙනවා. ඔබතුමාට අපි දායක වුණා වගේම ඔබතුමා මේ ගේන අයවැය කොච්චර හොඳ වුණත් සමහරවිට අපි දවසක විරුද්ධ වෙන්න පුළුවන්. ඒ ඔබතුමා බෙදන හැන්ද සමස්තයක් හැටියට පොදු නොවුණොත්. ඉතින් එහෙම වෙන්න එපා අපි තව අවුරුදු තුනක් විතර ඉන්නවා. ඒ වගේම රටට හා ප්‍රදේශයට අලව්ව ප්‍රාදේශීය සභාව ආදර්ශයක්. අනිත් ප්‍රාදේශීය සභාවල සහ නගර සභාවල ඇතිවන ගැටලු පේනවානේ. මේ අයවැයේ ක්‍රියා කරා වගේම අපි සියලු දෙනා එකතු වෙලා ඉදිරි අවුරුදු වලත් ඒ වැඩ ටික කරගෙන යන්න වාසනාව උදා වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අරුණ මන්ත්‍රීතුමා කීවා වගේ හොඳ වැසිකිලි පද්ධතියක් හදන්න ඕනි කියලා කියපු කතාවේ අපි දුප්පත් කියලා කීවාට අපි ඉන්නේ පොහොසත්ම තැනක. කොළඹ ඉඳලා යාපනයට යනකල් යන්න ඕනි අලව්ව නගරය හරහා. අලව්වේ ටවුන් එකට කොටසක් ඒකේ තියනවා. ඒ කොටසේ වැසිකිලි දෙකක් දැම්මත් හම්බ කරන්න පුළුවන් ක්‍රමවේද ඔබතුමා දන්නවද කියලා දන්නේ නැහැ. සංචාරක ව්‍යාපාර කරන කට්ටිය හදන්නේ ලොකු කෝපි ෂොප් එකක්. එතන ලොකු බෝඩ් එකක් දානවා වැසිකිලි පහසුකම් තියනවා කියලා. අනිවාර්යෙන් ඒ බස් එක නවත්තන්න පුළුවන්, ඒ පහසුකම් තියේ නම් කෝපි ෂොප් එකළඟ නවත්තලා සල්ලි දීලා කෝපි බීලා වැසිකිලි පහසුකම නොමිලේ ලබා ගන්නවා. බෝයවලානේ අන්නාසි කොටුවේ එහෙම එකක් තිබුනා දැන් තියනවාද නැද්ද දන් නැහැ. එහෙම වැසිකිලි දෙකක් පාරේ වමට දකුණට දැම්මොත් දේශීය මිනිස්සුන්ට වෙනම පොඩි ගාණක් සහ සංචාරකයින්ට වෙනම ගාණක් අය කරනවා. මන් කියන්නේ වැසිකිලි පද්ධතියකින් දියුණු වෙනවා කියන එක නෙවේ. අපිට හොඳ අවස්ථාවක් තියනවා සභාවට ආදායමක් උපයාගන්න. හොඳ ආදායම් මාර්ගයක් අලව්වේ ඉඳලා වළකුඹුරට යනකල් කොහේ හෝ සීමාවක නිර්මාණය කරන්න කියලා මතක් කරමින් සියලු දෙනාටම මේ වගේම හොඳ සුභ දවසක් උදා වෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ මහජන නියෝජිතයා හැටියට ප්‍රාදේශීය සභාවේ විධායක බලයක් හොබවන ඔබතුමා, මධ්‍යස්ථ අයවැයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. ඒවගේම ලේකම්තුමිය ඇතුළු ප්‍රාදේශීය සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය සමගින් අයවැය සකස් කර එක තැනකට ගෙනල්ලා පුදුමාකාර වූ කැපකිරීමක් කරලා තමන්ගේ රාජකාරියට එහා ගිය කාර්යභාර්යක් සිදු කරලා මෙවැනි අයවැයක් සම්පාදනය කිරීම සම්බන්ධව ගෞරවනීය ස්තූතිය පුද කරනවා. ගරු සභාපතිතුමනි, මේ අයවැය ගත්තහම මම මධ්‍යස්ථයි කියන්නේ නරකමයි කියලා නෙවේ. මේක අර්බුද රාශියකට මුහුණ දෙන අයවැයක්. මහා භාණ්ඩාගාරයෙන් රාජ්‍ය සේවකයින් සඳහා ප්‍රතිපූර්ණය කරන්නා වූ මුදල් 40%ක් අහිමි වෙන අයවැයක්. ඒක අපි උත්පාදනය කළ යුතු අයවැයක්. ඒ හින්දා එවැනි උත්පාදනය කිරීමක් සඳහා මේ අයවැය ඇතුලේ වැඩපිළිවෙලක් යෝජනා වෙලා තියනවා මම දැක්කේ නැහැ. ඒක තමා ලොකුම අභියෝගය. ඒ අභියෝගය ජයග්‍රහණය කරන්න ඕනි. අයවැය ඇතුලේ මේකේ උදාහරණ රාශියක් තියනවා. මම එක තැනක් පෙන්වන්නම්. අංක 03 වැඩසටහන භෞතික සැලසුම් ඉඩම් කියන වැය ශීර්ෂ යටතේ 10 කොටස ඇතුලේ තියනවා බැනර්, දැන්වීම් පුවරු ප්‍රචාරණය කිරීම. අද ගත්තහම හැම තැනම බැනර් ප්‍රදර්ශනය කරනවා. බෝඩ්ස් අලවනවා, අපේ ගාමන්ට් ෆැක්ට්‍රිවල බෝඩ් හැමතැනම ගම්වල වීදිවල ප්‍රදර්ශනය කරනවා. ඒවගේම ප්‍රචාරක දැන්වීම් පෝස්ටර් අලවනවා. ඒ සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ හරියට වැඩපිළිවෙලක් යෝජනා කරලා ඒ ආදායම අපිට ගන්න වැඩපිළිවෙලක් දියත් වෙනවා කියලා මම දකින් නැහැ. ඒවගේම යම් යම් අපහසු කාරණාත් තියනවා. ඒවා විධිමත්ව ඒකරාශි කරගැනීම සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ඉන්නවද කියන ගැටලුවකුත් තියනවා. ඒ කෙසේ වෙතත්, ඒ අභියෝගාත්ම කරුණු කාරණා එකතු කරගන්න වැඩපිළිවෙලකට යන්න ඕනි. සමහර බැනර් අපේ කම්කරුවෝ කෙක්කත් දාලා කැපුවත් ඒවා ඉවත් කරන්න කම්කරුවන්ට මාර්ගවල යන්න අපහුසයි. එතකොට ඒවා ඉවත් කරගන්න බැහැ. ඒ නිසා ඒ තුළින් ලැබෙන ආදායම පිළිබඳව සෑහීමකට පත් වෙන්න බැහැ. ඒවගේම මේ අයවැය ලේඛනයේ දකිනවා ගිය අවුරුද්දේ උත්පාදනය කරපු ආදායමට වඩා අඩු ආදායමක් තමා සමහර වැය ශීර්ෂවල ඉදිරියේ පෙන්නලා තියෙන්නේ. ගිය අවුරද්ද සම්බන්ධව උදාහරණයක් ගමුකෝ රු.25000ක් අපිට ආදායම උත්පාදනය වෙලා තියනවා නම්, මේ අවුරුද්දේ රු.10000 ක් හා ඊට අඩුවෙන් ආපු වැය ශීර්ෂ තියනවා. සමහර විට ඒවා වෙනත් ඒවත් සමඟ ආපු කාරණාද කියන්න මම දන්නැහැ. වැය ශීර්ෂ හැටියට ගිය පාර අයවැයේ යනකොට නම්කරන ඒවාත් තියනවානේ. ඒකට ඇතුළත් වෙන්න ඕනි ඒවා තියනවා. ඒවා පසුකාලීනව වෙනත් වැය ශීර්ෂයකට ගන්නවා එහෙම එකක්ද කියන්න මම දන්නැහැ. විශේෂයෙන්ම කතා කරන්න තියෙන්නේ අපේ මන්ත්‍රී ප්‍රතිපාදන සම්බන්ධව. ගිය පාර අපිට සභා කර්මාන්ත 9-9-5 වැය ශීර්ෂයෙන් එක්කෝටි හැටපන් ලක්ෂයක් වෙන් කරලා තියනවා. හැබැයි මේ පාර අපිට කෝටියයි වෙන්කරලා තියෙන්නේ. ඒක ඇවිල්ලා තියනවා මන් හිතන්නේ උඩින් වැය ශීර්ෂයකින් වෙන් කරලා තියනවා. 9-9-5 කියන වැය ශීර්ෂය. එතනින් අලුත් කෝටියක් උඩට ඇවිල්ලා තියනවා. මන් හිතන්නේ ඒක ආදාහනාගාරය සම්බන්ධයෙන් වෙන් කරපු කෝටියද කියන්න මම දන් නැහැ. මම හිතුවේ ඒක වෙන්න ඇති කියලා. අපිට කෝටියෙන් හදන්න බැහැ අපි ණයක් ගන්න වෙයි. ණයක් විදිහට ඒක ඉදි කරලා, මම යෝජනා කරන්න හැදුවේ ඒ කෝටියත් සභා කර්මාන්තවලට අරගෙන අපිට පුළුවන් මන්ත්‍රී ප්‍රතිපාදන ලක්ෂ පහකට යන්න. ලක්ෂ පහකට යනවා නම් මන් හිතන්නේ එක්කෝටි හතලිස් පන් පක්ෂයක් විතර වෙන්නේ. අපිට එහෙම කරන්නත් පුළුවන්. හැබැයි ඔබතුමා මේ සභාවේ සභාපතිවරයා හැටියට කොයි මොහොතකවත් තුන්ලක්ෂ පනස්දහස ලබා දීම සම්බන්ධයෙන් හැල්ලුවකට ලක් කරනවා නෙවේ. ඒ ප්‍රතිපාදනය ලබා දීම සම්බන්ධව නම්‍යශීලී වීම ගැන ස්තූතිවන්ත වෙනවා. ඔබතුමාට මේ ප්‍රතිපාදන විපක්ෂය සඳහා වෙන් කිරීමේදී අර්බුද මතුවෙන්න ඇති කියලා මම හිතනවා. නමුත් එහෙම වෙලා නැත්නම් හොඳයි. මගේ සහෝදර ගරු චමින්ද මාල් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ දීර්ඝ කාලයක් දේශපාලන ඉතිහාසයක් තියන ඔබතුමා අපිත් එක්ක ප්‍රාදේශීය සභාවල යම් යම් සටන්වලට මුර දුන් කෙනෙක් හැටියට අපිත් එක්ක ඒකරාශී වුණ කෙනෙක් හැටියට, මම හිතුවා ඔබතුමා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරායා වෙන කොට සියලු මන්ත්‍රීවරු වෙනුවෙන් මධ්‍යස්ථභාවයෙන් කටයුතු කරයි කියලා. අද ඒක ප්‍රායෝගිකව ඔප්පු වෙලා තියනවා. ගරු සභාපතිතුමනි, තව කාරණයක් කියන්න ඕනි මේ අයවැය ලේඛනය කියන්නේ උපකල්පනයක් විතරයි. මේ ආදායම අපිට උත්පාදනය වෙන්නත් පුළුවන් නොවෙන්නත් පුළුවන්. ගරු සභාපතිතුමාට අපි වෙනුවෙන් වෙන් කරපු මුදල් දෙන්නත් පුළුවන් නොදෙන්නත් පුළුවන්. අපි මේ යෝජනාවල මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා නිලධාරීන් හරහා ක්‍රියාත්මක වෙනකොට, ඒ මුදල් එතනින් එහාට ගමන් නොකරන විදිහට පරිපාලනය ක්‍රියාත්මක කරන්නත් ඔබතුමාට පුළුවන්.

ඒ නිසා ඔබතුමා අපි ගැන බලාපොරොත්තුවක් තියලා, අපි ඔබතුමා ගැන විශ්වාසයක් තියලා මේ අද කතා කරන කාරණාත් එක්ක මේක යථාර්තයක් හැටියට මහ පොළොවේ පැළ කරන්න ඔබතුමාගේ සහයෝගය මේ වර්ෂය තුළ ලැබෙයි කියලා විශ්වාස කරනවා. ඒ වගේම සභාපතිතුමනි, අපේ මන්ත්‍රීතුමන්ලා කතා කරනකොට එක තැනක කියවුණා, පරිපාලනය පිළිබඳව යම් යම් දුර්වලතා එක්ක මේ ආණ්ඩුවේ වැඩපිළිවෙල ඉදිරියට ගෙනියන එකේ නිලධාරීන්ගේ ප්‍රශ්නයක් තියනවා කියලා. විශේෂයෙන් කතා කරන්න ඕනි අපේ සභාවේ යම් දුර්වලතාවයක් තියනවා නම්, ඒ පරිපාලනයේ දුර්වලතාවයේ ප්‍රධාන වගකියන නිලධාරියා විදිහට ප්‍රාදේශීය සභා පනත අනුව ඉන්නේ ගරු සභාපතිතුමා. අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා කියන්නේ, මහජන නියෝජිතයෙක් හැටියට මේ ගරු මහසභාවට ඇවිත් විධායක බලය හසුරවන්නා විතරක් නෙවේ මේ ආයතනයේත් ප්‍රධාන විධායක නිලධාරියා පනතෙන් ගරු සභාපතිතුමා. ඒවගේ මේ රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රධානියාත් එතුමා. රාජ්‍ය නිලධාරී යාන්ත්‍රණයක සභාපතිතුමාට බලය ලැබෙන එකම ආයතනයත් ප්‍රාදේශීය සභාවයි. මෙතුමත් මේ පුටුවේ ඉඳගත් මොහොතේ සිට විධායක නිලධාරියකුගේ බලය හොබවනවා. නිලධාරීන්ගේ යම් අඩුපාඩුවක් සිදු වෙනවා නම්, නිලධාරියෙකුට ඇඟිල්ල දික් වෙනවා නම්, ඒ ඇඟිල්ල දික් වෙන්නේ මුලින්ම නිලධාරීන්ගේ ප්‍රධානියා වන එතුමාටයි. ප්‍රාදේශීය සභා පනත අනුව එතුමාටයි ඇඟිල්ල දික් වෙන්නේ කියලා ඔබතුමාලා මතක තියාගන්න ඕනි. ඊළඟට විශේෂයෙන් කියන්න ඕනි ආදායම් උත්පාදනය පිළිබඳව. මේ අයවැය තුළ එහෙම කාරණයක් මම දකින් නැහැ. එදා ඔබතුමාට අපි කමිටුවකදී කීවා යත්තල්ගොඩ ඉඳලා යාන්ගල්මෝදර දක්වා දුම්රිය රක්ෂිත ඉඩම් තියනවා ඒ ඉඩම් ටික රාජ්‍ය ආයතනයක් හැටියට ප්‍රාදේශීය සභාවට ඉල්ලපුවාහම, දුම්රිය දෙපාර්ත මේන්තුව අපිට දෙන් නැහැ. හැබැයි පුද්ගලික අයට දෙනවා. පුතාගෙන් දුවට දෙනවා දුවගෙන් බෑණාට දෙනවා සමහර වෙලාවට ඒ ඉඩමේ අයිතිකාරයෝ අද මෙහේ නැහැ. ඉන්නේ කොළඹ, එක්කෝ ගාල්ලේ නැත්නම් අනුරාධපුර එක්කෝ වෙන කොහේ හරි. මේ ටික ප්‍රාදේශීය සභාවට දුන්නොත් අලව්ව සිට යාන්ගල්මෝදර දක්වා වැඩිම ආර්ථික ප්‍රතිලාභයක් ලබා ගන්න පුළුවන්. හොඳ ආදායමක් උපයන්න පුළුවන්කමක් තියනවා. අපිට ප්‍රාදේශීය සභාව හරහා බදු දෙන්න පුළුවන්කමක් තියනවා. එතකොට අපේ දේශීය ආර්ථිකය ඉහළට නංවන්න පුළුවන්. කෘෂිකර්මාන්තය වෙනුවෙන් කෙහෙල් ගහක් හැදුවොත් ඒකේ ආදායමක් ඇවිත් අලව්ව පොළට අලෙවි වෙනවා නම් ඒක තමා රටේ දේශීය ආර්ථිකය කියන්නේ. ඒ ආර්ථිකය ඉහළ නංවන්න පුංචි ආයතනයක් විදිහට ප්‍රාදේශීය සභාවට අපිට දිය හැකි ශක්තිය ධෛර්ය ඒක. ඒ වෙනුනේ වැඩපිළිවෙලක් මේ අයවැය ඇතුළේ මම දකින් නැහැ. ඒ නිසා මේවා ජයග්‍රහණය කරන්න මේවා ඇතුළේ තියෙන සියුම් තැන් අපි හොයාගෙන ගිහිල්ලා ආදායම් උත්පාදනය කළ හැකි සෑම තැනක ආදායම් උත්පාදනය කළ හැකි වැඩපිළිවෙලකට යන්න ඕනි. නමුත් ඒ වැඩපිළිවෙලට යනකොට හැමදාම සුපුරුදු දේ තමා ජනතාවගේ වරිපනම් බද්ද වැඩි කරලා ජනතාවට ගහන බද්ද වැඩි කරලා ඒකෙන් මේ ප්‍රාදේශීය සභාවේ ආදායම් උත්පාදනය කරන්න බලාපොරොත්තු වෙනවා නම්, ඒ සඳහා මාගේ විරෝධය ප්‍රකාශ කරනවා. හැබැයි ඊට එහා ගිය නිර්මාණශීලි නායකයෙකුට නිර්මාණශිලි වැඩපිළිවෙලක් එක්ක ප්‍රාදේශීය සභාවේ ඕන තරම් ආදායම් උත්පාදනය කළ හැකි කාරණා තියනවා. අපේ ප්‍රාදේශීය සභාවේ වෙන්දේසි ඉඩම්වල ප්‍රමාණය එකතු කරන්න ගරු සභාපතිතුමනි. පොදු කටයතු සඳහා වෙන් කරලා තියන භූමි ප්‍රමාණ හොයා ගන්න. ඊළඟට සුසාන භූමි ටික තියනවා ඒවායෙහි ආදායම් උත්පාදනය කර ගන්න පුළුවන්. බැරිකමක් නැහැ හැබැයි නිර්මාණශීලි නායකයින්ට ඒක පුළුවන්. වළකුඹුරේ බැම්ම ගත්තහම වැසිකිලි පද්ධතියක් ගැන රාජ් කුමාර් මන්ත්‍රීතුමා අද කතා කරා. එතුමා කියපු වැසිකිලි පද්ධතිය ඉදි කරන්න පුළුවන්. හොඳම තැන තමා ඒ වළකුඹුරේ ඉදි කරලා තියන බැම්ම. ඒත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ ඉඩම දෙන්න ගිහාම ප්‍රශ්න. මේ රාජ්‍ය ආයතන ඇතුළේ ගැටුම්. රාජ්‍ය ආයතන ඇතුළේ එකේක අණපනත් නීතිවලට හිරවෙලා. ආණ්ඩු පක්ෂයෙන් අන්න ඒ ගැටලු ටික විසඳලා දෙන්න ඕනි.පාර්ලිමේන්තුවට, ජනාධිපතිතුමාට, කැබිනට් එකට කතා කරලා ,දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ගිහිල්ලා එතනින් විසඳුන් නැත්නම් කැබිනට් එකට ගිහිල්ලා මේ ප්‍රශ්න ටික විසඳා ගැනීමේ වගකීම ආණ්ඩුවට තියනවා. එහෙම නැත්නම් අපේ චමින්දමාල් ගරු මන්ත්‍රීතුමා අවුරුදු ගාණක සිහිනයක් දැකලා ඒ සිහිනය අද යථාර්ථයක් බවට පත්වෙලා තිබ්බට අවුරුදු පහ ගිහිල්ලා ආපහු හැරිලි බලනකොට සිහිනෙත් නැහැ නින්දෙනුත් ඇහැරෙන්න වෙනවා. මේවා තේරුම් ගන්න. ඔබ බොහෝම කැප කිරීමෙන් හදාගත් ආණ්ඩුවක් නම්, ආණ්ඩුව හදා ගත්තා කියලා සැනසීමකට පත් වෙන් නැහැ ජනතාව බලාපොරොත්තු වෙන්නේ වෙනස් දෙයක් ගරු සභාපතිතුමනි. අන්න ඒ වෙනස අවුරුදු 76ක් සමඟ කරන්නයි ඔබ ආවේඅපේ විපක්ෂයේ පක්ෂවලට වඩා හොඳට ඊට වඩා වෙනස් විදිහේ වැඩපිළිවෙලකට ගිහිල්ලා ජනතාවට මීට වැඩිය හොඳ යථාර්තවත් ප්‍රායෝගික වැඩපිළිවෙලක් ඉදිරියට එන එකක් තමා මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ. ඔබ වෙනස හරියට තේරුම් අරන් තියනවාද කියලා මම දන් නැහැ ඒත් විපක්ෂයේ හිටියත් මම නම් ඒ වෙනස තේරුම් අරන් ඉන්නවා.

මම එක දවසක් කීවා මේ ආයතනවල නිලධාරීන්ගේ අඩුපාඩු නොවේ ඔවුන් රාජ්‍ය වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන්න රාජ්‍ය යාන්ත්‍රණයට බාධා කරන් නැහැ. හැබැයි මේ නිලධාරීන්ට ආයතන සංග්‍රහය, චක්‍රලේඛ, ආයතන ව්‍යාවස්ථාපිත කාරණා, මුදල් රෙගුලාසි තියනවා ඒවත් එක්ක මේගොල්ලෝ හිර වෙලා ඉන්නවා. අන්න ඒ හිරවෙච්චි කාරණා නිලධාරීන්ගෙන් අහලා පාර්ලිමේන්තුවේ අලුතෙන් පනත් ගෙනල්ලා සම්මත කරලා චක්‍රලේඛ නිකුත් කරලා ගැසට් නිකුත් කරලා හරි ඒවා නිවැරදි කරලා දුන්නහම රාජ්‍ය නිලධාරින් කාර්යක්ෂමව වැඩ කරයි. එහෙම නැතුව පරණ ඒවා එහෙම්ම ම තියාගෙන මේ නිලධාරීන්ට කරන්න කියලා කීවට කරන් නැහැ ඒකට හේතුව තමා මේ නිලධාරින්ට පැන්ෂන් ඕන දරුවෝ ඉන්නවා. පවුලක් තියනවා. ඒගොල්ලන්ගේ රාජ්‍ය සේවයේ වගකීම ගන්න පුළුවන් මහජන නියෝජිතයෙක් මම අද දකින් නැහැ. නිලධාරීන්ගේ යම් කාර්යබාර්යක් වගකීමක් ගත්තහම ඒකට වගකිය මහජන නියෝජිතයෝ නැහැ. මම මේ ආණ්ඩුවේ දකින එකම දුර්වලතාවයක් ඒක . ඒ නිසා නිලධාරියා ගන්න තීරණය සම්බන්ධව වගකීම මහජන නියෝජිතයෝ ගන්න ඕනි. මේ ආණ්ඩුවේ එහෙම නැහැ නිලධාරියා හුදකලා වෙලා. වගකීම වෙනුවෙන් පෙනී ඉන්න කෙනෙක් නැහැ. අන්න ඒවා නිවැරදි කර අර දැකපු හීනය යථාර්තයක් කරගන්න. ඒක තමා හරිම පාර. මම මේ කියන ඒවා විවේචනයක් කියලා ඔබ දකිනවා නම් ඔබට ඒක විවේචනයක් ලෙස පෙනීමේ අවසාන ප්‍රතිඵලය හොඳ දෙයක් බවට පරිවර්තනය වෙන්නේ නැහැ. ඒ නිසා මේවා වෙනස් වීම් කරගන්න ඕනි. මේක අලව්ව ප්‍රාදේශීය සභාවේ යාන්ත්‍රණයට විතරක් නෙවේ සමස්ත රටේම රාජ්‍ය නිලධාරීන්ට තියන බාධක ටික ඉවත් කරලා දුන්නොත් යහපත් ගමනකට පරිවර්තනය කරන්න පුළුවන්. ඒ නිසා ආදායම් උත්පාදනය කරලා ප්‍රාදේශීය සභාවේ ආදායම ඉහළට ගේන්න නම් මම කියපු දුර්වලතාවයත් මඟ හැරවලා කටයුතු කරන්න නිලධාරීන්ට අවස්ථාව දෙන්න ඕනි. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි අයවැය පරාද කිරීම් ගැන කතා කළා. මම අවුරුදු 23ක් අඛණ්ඩව ප්‍රාදේශීය සභාව නියෝජනය කරා. අලව්ව නාරම්මල ප්‍රාදේශීය සභාව ස්ථාපිත වීමට පෙරත් මේ සභාව නියෝජනය කරා. ඒකේ හිටපු ලාබාලතම මන්ත්‍රීවරයා මම. ඒ නිසා අලව්ව ප්‍රාදේශීය සභාව අභියෝග ගණනාවකට මුහුණ දුන්නා. ඒ අභියෝග තමා අලව්ව නාරම්මල කියලා ප්‍රාදේශීය සභා දෙකක් නිර්මාණය වෙනකොට අපේ වත්කම්වලින් අති බහුතරයක් නාරම්මල ප්‍රාදේශීය සභාවට හිමිවීමයි. ඒවායින් උදාහරණයක් විදිහට එකක් ගන්නම්, ආදාහනාගාරය තිබ්බේ අලව්ව ප්‍රාදේශීය සභාවට අපේ ප්‍රතිපාදනවලින් තමා ඉදි කළේ. ඒත් භූමිය වෙන්වෙනකොට අපිට ඒක අහිමි වෙලා ගියා. මේ ආදාහනාගාරය ඉදි කරන්න ඒ මොහොතේත් ප්‍රශ්න තිබ්බා. ඒකට ප්‍රධාන සාධකයක් තමා අලව්ව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් බොහෝම අඩුයි. ඒ නිසා ඒවා පිළිබඳවත් ගරු සභාපතිතුමනි අවධානය යොමු කරන්න. ඉඩම් නැත්නම් අපි ඉඩම් සංවර්ධනය කරලා ලබා ගන්න ඕනි. ඒ වෙනුවෙන් වැඩපිළිවෙල වේගවත් කරලා කාර්යක්ෂම කරලා නිලධාරීන්ට තියන බාධා අයින් කරලා ඒ ටික සකස් කරලා දෙන්න අපි කටයුතු කරන්න ඕනි. එවැනි භූමි වගේම අපේ යන්ත්‍රෝපකරණ ටික අපිට අහිමි වුණා. ඒවා නාරම්මල සභාවට ගත්තා එවකට නාරම්මල ප්‍රදේශය නියෝජනය කරන සුමනසිරි සභාපතිවරයා තමා හිටියේ. එවෙලේ මේ වත්කම් බෙදීම සම්බන්ධව අපි මහා අරගලයක් කරා. වත්කම් බෙදීම සම්බන්ධව වැරදියි, අපිට එන්නේ අවම වත්කම් ප්‍රමාණයක් කියලා හිටපු සන්ධ්‍යා සභාපතිතුමත් එක්ක හැප්පුණා. 50ට 50ට බෙදන්න ඕනි කීවා. එවේලාවෙහි 50 ට 50 එනවා කියලා සුමනසිරි සභාපතිතුමාගේ දේශපාලන දැනුම ඥානය පාවිච්චි කරලා සන්ධ්‍යා කුමාර සභාපතිතුමා රවට්ටලා එතනදීත් අපිට හම්බුනේ පොඩි ප්‍රමාණයයි. එතනින් තමා අලව්ව ප්‍රාදේශීය සභාව ගොඩාක් පහළට වැටෙන්න පටන් ගත්තේ. හැබැයි මේ අභියෝග පැත්තක තියලා ඒවා අමතක කරලා අපිට යන්න බැහැ කියලා නෙවේ අපි අභියෝග ජයග්‍රහණය කරන්න ඕනි. ඒ නිසා කොහොම හරි උදව් කරලා මේ ප්‍රදේශයේ 65000ක අධික ජනතාව වෙනුවෙන් මහජන නියෝජිතයන්ගේ වගකීමක් යුතුකමක් තියනවා ජනතා මෙහෙවර කරන්න. ඒ නිසා මේ අවුරුදු 23 ක මගේ දේශපාලන ජීවිතයේ පරාද කළේ එක අයවැයයි. අපි පාරද කරේ හෘද සාක්ෂියට එකඟව නෙවේ. අපි ඒක පරාද නොකර, හිටපු සන්ධ්‍යා සභාපතිතුමත් එක්ක සාකච්ඡා වට ගණනාවක් තියලා යම්කිසි එකඟතාවයකට මධ්‍යස්ථබාවයකට පැමිණ උළුවස්සෙන් එළියට එනකොට සන්ධ්‍යා සභාපතිතුමා මන්ත්‍රීවරුත් එක්ක පටලැවිලි හදාගන්නවා. නමුත් අපි අයවැය පරද්දන තැනක හිටියේ නැහැ. මැදිහත් වෙලා කටයුතු කළා. හැබැයි ඔබතුමත් සමහර වෙලාවට අයවැයට කැමති වුණත් පක්ෂ තීරණත් එක්ක අයවැයට පක්ෂ වෙන්න බැරි වුණා. එවෙලේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු දෙන්නා ඒ අයවැයට අත උස්සලා විරෝධතාවය ප්‍රකාශ කළත් හැබැයි මේක හොඳයි පක්ෂයි කියලා අනිත් පැත්තෙන් අපිට සහයෝගය දුන්නා. එවැනි කටයුතු මේ සභාවේ සිදුවුණා. ඊළඟට දැන් සභාවක් ඉදිරිපත් කරන්නා වූ අයවැය සම්බන්ධව ඔබතුමාට සියලු දෙනා සහයෝගය දෙනවා.

නැවත මේ අයවැය ඉදිරිපත් නොවුනා වුණත් ආදායම් උත්පාදනය සම්බන්ධව වැඩපිළිවෙලකට ඔබතුමා එන්න. වළකුඹුර බැම්ම ඇතුළේ දෛනික ආදායම ලක්ෂ පහක් පමණ උපයන්න පුළුවන් තැනක්. වැසිකිලි පද්ධතිය ඉදි කරලා, අනික මා ඔයට බැහැලා එන ලොරි රථ රියදුරෝ මැරිච්ච අවස්ථා තියනවා ඒ නිසා ඒ එන අයට අපි එතන නාන්න ෂවර් පද්ධතියකුත් හදලා ඒ අනතුරත් පහ කරලා කීයක් හරි මුදලකුත් අය කරලා, රැකියා අවස්ථා කිහිපයකුත් නිර්මාණය කරන්න පුළුවන් තැනක්. ඒ නිසා අලව්ව සභාව ඇතුළේ ආදායම් උත්පාදනය කරන්න පුළුවන් කාරණා කිහිපයක් මම කීවේ. ඒවගේ තව රාශියක් තියනවා. සියල්ලම සාකච්ඡා කරලා අපි වැඩපිළිවෙලකට යමු කියන කාරණාව යෝජනා කරමින්, මේක අයවැය උපකල්පනයක් විතරයි ඒ සඳහා ඔබතුමාට අපේ ශක්තිය ධෛර්ය විතරක් නෙවේ ඒ වෙනුවෙන් ආදායම් උත්පාදනය කරන්න ඒකාබද්ධ විපක්ෂයක් හැටියට අපි සියලු දෙනාගේම ශක්තිය එකතු කරලා අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉන්න අහිංසක ජනතාව වෙනුවෙන් යමක් කිරීම සඳහා ඒ ශක්තිය එක් කරනවා කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, නවක සභිකයෙක් විදිහට අපි හැමදාම පාර්ලිමේන්තු අයවැය දැක්කේ සමාජ මාධ්‍යයෙන් නැත්නම් පත්තරයෙන් හෝ රූපවාහිනියෙන්. අලව්ව ප්‍රාදේශීය සභාවෙත් පෙර අයවැය අවස්ථා පත්තරෙන් සමාජ මාධ්‍ය තුළින් දැක්කේ. මහජනතාව විසින් එක් කොට්ඨාසයකට සභිකයෙක් විදිහට මෙතෙන්ට එවීම ගැන මම සතුටු වෙනවා. මෙතෙක් අපි මාස හයක් බලාත්මක කරපු අයවැයක් කරගෙන ගියේ. අලුතින් හදපු අයවැයකට අත උස්සන්න, අගයන්න සමාලෝචනය කරන්න ආපු එක ගැන සතුටුයි. ඇත්තටම මහජනතාවගේ ජන ජීවිතය අඩාල නොවී ඉදිරියට අරන් යන කාර්යයන් ටික තමා රාජ්‍ය ආයතනවලින් ඔවුන් බලාපොරොත්තු වෙන්නේ. අපි සභිකයෝ විදිහට, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා විදිහට මහජනතාව ඉදිරියට යන්න ඕනි ඒ ප්‍රතිලාභයන් ඒගොල්ලන්ට අරගෙන යන්නේ කෙසේද, ඒ සඳහා පෙළගැස්මක් සභාවේ ඉන්න ලේකම්තුමිය ගරු සභාපතිතුමාගේ උපදෙස් සහ ඇගයීම් උකහා ගනිමින්, විභවයන් උකහා ගනිමින් සමාජයේ තියන දේවල් හරහා ආදායම් උත්පාදනය කරන්නේ කොහොමද කියලා හඳුනා ගනිමින් ගිය අවුරුද තුනක විතර පෙළගැස්මකුත් අරගෙන මේ කෙටුම්පත් හදලා ඒකේ අය සහ වැය මොනවාද කියලා ප්‍රජා සංවර්ධන සහ  පරිසර වැඩවලට ආදී යන සියලුම විෂයන්වලට බෙදලා ඉතාම ක්‍රමානුකූල අයවැයක් හදලා තියනවා. ඒ ගැන අපිට හරි සතුටුයි. මේ සම්බන්ධයෙන් සැහෙන මහන්සියක් වෙන්න ඕනි කියලා අපි දකිනවා. අපි සභිකයෝ විදිහට ස්තූතිවන්ත වෙන්න ඕනි. ඊළඟට මේ අයවැයේදී අපි හැම වෙලාවේම පොදුවේ හිතන කාරණය තමා සමාජයට යන වෙලාවට අපි ඒ ගොල්ලන්ට ප්‍රතිලාභ අරන් යන්න නම් අපිට තියන දේවල් උකහා ගෙන උත්පාදනය කර ගන්න ඕනි. අපේ ගරු චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමා කීවා වගේ අනිත් මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා පැවසුවා වගේ නව උත්පාදනයන්වලට යන්න ඕනි. සංවර්ධන වැඩවලට කුඩා ප්‍රමාණයක් දැම්මත් ගිය අවරුද්දේ එක් කෝටි හැටපන් ලක්ෂයක් සංවර්ධන වැඩවලට යොදවලා තිබුණා. මගේ කොට්ඨාසයේ වගකීම භාර අරන් මේ සභාවට එනකොට සන්තොසයි මගේ කොට්ඨාසයට ග්‍රාම සේවා වසම් තුනකට ලක්ෂ පහ ගාණේ දාලා තිබුණා. ඊට අමතරව පන්ගොල්ල කියන වසමට රේඛීය අමාත්‍යාංශයෙන් බෝක්කුවකට ලක්ෂ පහක් ඇවිල්ලා තිබුණා. මේ වෙලාවේත් අපිට කොට්ඨාසයකට සභිකයෝ දෙන්නෙක් ඉන්න නිසා ලක්ෂ හතක් වැටිලා තියනවා. ඉතාම කුඩා ආදායමක් තිබ්බත් ඒකෙන් යම් කොටසක් මෙතෙන්ට වෙන් වුණ එක ගැන සන්තෝසයි. ගිය අවුරුද්දේ විසිතුන් කෝටි තිස්හය ලක්ෂයක ආදායමක් තිබුණු ප්‍රාදේශීය සභාව ලබන අවුරුද්දට විසිතුන් කෝටි පනස්හය ලක්ෂයක ආදායමක් බලාපොරොත්තු වෙලා තියනවා. ඒ කියන්නේ වැඩිපුර ලක්ෂ විසිතුනක විතර ආදායමක් බලාපොරොත්තු වෙලා තියනවා. ඊළඟ අවුරුද්දට අයවැය හදනකොට අපි සියලු දෙනා මේ අයවැයෙන් බිමට යෝජනා ගෙනියන ගමන්ම ප්‍රාදේශීය සභාවට ආදායම උත්පාදනය වන වැඩවලට යොමු වී අපි මැදිහත් වෙලා කටයුතු කරමුයි කියන ඉල්ලීම සහ සභාපතිතුමත් සමඟ අපි සියලු දෙනා පෙළ ගැහෙමු කියන ඉල්ලීම මේ වෙලාවේ කරනවා. ඊළඟට අපි හඳුනගත්ත තැන් කිහිපයක් තියනවා. අපි උදේට සභා ගීතය කියන්නෙත් දහඩියවලට පණ දී උදා කරලමු අලව්ව පුරයට සොඳුරු හෙට දවසක් කියලා ඉතින් අලව් පුරවරයට කීවාහම අලව්වේ නගරයට විතරක් නෙවේ ඊට එහා ගිය මුළු ප්‍රදේශයටම මේ දහඩිය ටික අපි හෙලලා ඒ අවස්ථාව උදා කරන්න අපි එකතු වෙමු. මගේ යෝජනාවක් විදිහට ගේනවා බෝයවලාන නගරය මීට වඩා සැලසුම් කරමු ඒවායේ ආදායම් හොයාගන්න පුළුවන් තැන් තියේ නම් ඒවා හඳුනාගෙන ආදායම සභාවට ගේමු. ඊළඟට මහරච්චිමුල්ල ඉතාම ඉක්මනින් දියුණු වෙන නගරයක්. සභාවට අයිති භූමියක් තියනවා. අපේ කරුණාරත්න මන්ත්‍රීතුමා දන්නවා ඇති. ඒවා පිළිබඳව සොයා බලලා ඒවට වැඩපිළිවෙලක් අපි ගේමු.

ඊළඟට මාපිටිය කියන නගරය අපි එදා දැක්ක නගරය නෙවේ දැන් තියෙන්නේ. අපේ ගරු උපසභාපතිතුමිය නියෝජනය කරන කොට්ඨාසය .ඒ නගරයෙත් ප්‍රාදේශීය සභාවට අයිති භූමි තියනවාද බලමු. ඒවාට වැඩපිළිවෙලවල් සැලසුම් කරමු. ඊළඟට පඹදෙණිය, නවතල්වත්ත, කොට්ටවත්ත මේ සියලු නගරවලට අඩුම ගාණේ කොම්පෝසට් පැකට් ටික හරි විකුණ ගන්න කුඩා අලෙවි සැල් ටිකක් සභාවෙන් යොදවලා අඩු ආදායම්ලාභි පුද්ගලයෙක් ඒ තැනට දාලා එයාටත් කොමිස් එකක් එන විදිහේ වැඩක් හදලා ආදායමක් සභාවට ගේන්න කටයුතු කරමු කියලා මම යෝජනා කරනවා. පහුගිය සතියේ මම කුරුණෑගල ප්‍රවාහන අමාත්‍යාංශයේ ප්‍රවාහන ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ ගණනාවක් අයිති ලේකම් තුමා හමු වුණා. එතුමා ග්‍රාම සංවර්ධන පොර්තමේන්තුවේ වයඹ පළාත් අධ්‍යක්ෂක තුමාට මාව අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් ලෙස හඳුන්වලා දෙනවා. එතුමා මගෙන් අහනවා අලව්වට ආදායම් හොයන්න තැන් තියනවා නේද අලව්වේ වළකුඹුර බැම්මක් ගහලා නේද කීවා ඊට පස්සේ යාන්ගල්මෝදර සළු සලක් තියනවා නේද කීවා ඒගොල්ලෝ හඳුනා ගත්ත තැනුත් තියනවා. ඒනිසා ගරු සභාපතිතුමා මැදිහත් වෙලා අපි ඒ තැන්වලට ගිහිල්ලා ඒ නිවේදන යෝජනා අපි සභාවට ගෙනල්ලා හොඳ ආදායමක් එන තැනක් හදමු. එතකොට තමා අර ගරු කියන නාමය එක්ක අපේ කොට්ඨාසවලට වසම්වලට යන්න පුළුවන් වෙන්නේ. අපි මහජන නියෝජිතයෙක් විදිහට එතෙන්ට යනකොටත් එතනත් හොඳ පෙළගැස්මක් තියෙන්න ඕනි ඒ නිසා මේ වෙලාවේ මම මගේ කොට්ඨාසයේ හිතවත් අනිල් මන්ත්‍රීතුමාට යෝජනාවක් කරනවා ලක්ෂ හතක් වගේ සුළු මුදලක් අපි දෙන්නටම හම්බ වෙලා තියනවා. පහුගිය දවස්වල ග්‍රාම සංවර්ධන සමිති, නොයෙකුත් ස්වේච්ඡා සංවිධාන, ගමේ ඉන්න රාජ්‍ය ආයතනවල නිලධාරීන්, ගමේ ප්‍රජාව සහ මහජන නියෝජිතයන් ඒකරාශී කරගෙන ගම්වල පෙළගැස්මක් හැදුවා. ඒ පෙළගැස්මේ වසම්වල තියන අඩුපාඩු මොනවාද, දිළිඳු පවුල් මොනවාද, නිවාස අහිමි කවුද, නිවාස අඩුපාඩු තියෙන්නේ කාගෙද යන ඒවා ඇතුළත් කරමින් හොඳ පෙළගැස්මක් හදා ගත්තා. සියලු දෙනා එකතු වෙලා ඒකමතිකව තීන්දු කළේ. .ඒකේ ප්‍රමුඛතා ලැයිස්තුවක් හදලා තියනවා. ඒ ප්‍රමුඛතා ලැයිස්තුව බලමු කියලා ගරු කොට්ඨාස මන්ත්‍රීතුමාට මම ඉල්ලීමකුත් කරනවා මම ළඟ කන්දෙගෙදර උතුර සහ දකුණ, හෙණ්ඩුවාව, හෙණ්ඩුවාවත්ත, පන්ගොල්ල ග්‍රාම නිලධාරී වසම් පහේම සැලැස්ම තියනවා. අපි ඒ ලක්ෂ 7 ශ්‍රමදායකත්වයක් දාලා මීට වඩා හොඳ සංවර්ධන යෝජනාවක් කරමු කියන ඉල්ලීමත් මම මේ ගරු සභාවේදී මගේ හිතවත් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. පන්ගොල්ලේ බෝක්කුව සංවර්ධනය කරන්න ලක්ෂ පහයි ආවේ බෝක්කුවේ කැට ගලවපුවාහ කැටයක් කැඩිලා, අනිත් කැට තුනම පරණයි. ඒ නිසා අපි නැවත ඇස්තමේන්තුව හැදුවා. එකේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරී මහත්වරු කීවා හය ලක්ෂ විසිහත්දාහක් යනවා කියලා. හැබැයි ග්‍රාම සංවර්ධන සමිතිය ඒකරාශි කරලා සාකච්ඡා කරාම ගරු සභාපතිතුමා යෝජනාව ගෙනවා අපි මේක එකතු වෙලා කරමු කියලා. ලක්ෂ පහෙන් අටදාහක් ලිපිගොනු ගාස්තුද, සියයට පහක් සමිතියටද යනවා. හය ලක්ෂ විසිහත් දාහක වැඩක් හාර ලක්ෂ විසිහතර දාහක් වෙන් වුණත් අපි එකතු වෙලා කරා. අන්න ඒවාගේ වැඩ ප්‍රජාව එකතු කරන් කරන්න පුළුවන්කමක් තියනවා. විපක්ෂයක කියලා යම් යම් තැන්වල කියවුණා. නමුත් අපි සියලු දෙනා සභිකයෝ ඒ බව ගරු සභාපතිතුමා හොඳට හඳුන ගෙන බේදයක් නැතුව අද සභිකයෝ කියන එක වටහා ගෙන නිලධාරී තුමන්ලා තුමියන්ලා එක්ක හොඳ අයවැයක් හදලා තියනවා. 2021 හෝ 2022 මේ සභාවේ අයවැයක් සම්මත කරන්න ගිය අවස්ථාවක් කොළ කැලි ගිනි ගන්නවා මේසයක් පෙරලෙනවා. එහෙම වකවානුවක් තිබුණ අවස්ථාවක අපේ ගරු සභාපතිතුමා මෙවගේ තැනකට ඇවිල්ලා තියන එක ගැන සතුටුයි. මම කීව පොඩි කොම්පොස්ට් පැකට් එක විකුණන අලෙවි සැල් වගේ නිර්මාණශීලී අදහස් ගෙනල්ලා ඒ සම්බන්ධව එකතු වෙලා සාකච්ඡා කරමු. මේ ගරු සභාව ඇතුළේ සංවාද විවේචන කරලා, හොඳ වැඩපිළිවෙලක් එක්ක සමාජයට හොඳ සභාවක් තියනවා කියලා පෙන්වමු. ඒවගේම අලව්ව ප්‍රාදේශීය සභාව නැතුවම බැරි ආයතනයක් බවට සමාජයට ගෙනියන්න ඕනි කියන ඉල්ලීමත් කරනවා. ඒ සඳහා ගරු සභාපතිතුමාටත්, ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයටත් ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාටත් ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා ඔබ සියලු දෙනා 2026 වර්ෂයේ අයවැය ලේඛනයට එකඟත්වය පල කරමින් ප්‍රකාශයන් ඉදිරිපත් කළ නිසා, එය සම්මත කිරීම සඳහා අත ඔසවා මෙම ගරු සභාවට එකඟත්වය පල කරන ලෙස මා ඉතාමත් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා.

ඒ අනුව, 2020/10/28 දින ප්‍රසිද්ධියට පත් කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව සකස් කර 2025.09.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ නිර්දේශය ලැබූ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද රු.235,931,000.00 ක ආදායමක් හා රු.235,931,000.00 ක වියදමකින් සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, මේ මංගල අයවැයේදී ඇත්තටම සතුටු ලබන්නේ සභාපතිවරයා විදිහට මම. ඒකට ඔබ කියූ කරුණුවලට එහා ගිය සුවිශේෂී හේතුවක් තියනවා. මම මේ පුටුවේ ඉදගත්ත දවසේ ඉදලා ප්‍රතිඥාවක් දීලා තිබුණා අනිවාර්යෙන් මේ 26 දෙනාම මගේ මන්ත්‍රීවරු කියලා කටයුතු කරනවා කියන එක. ඒක මම පළමුවැනි කතාවේදීම කීවා. ඒවගේ මට හැමදාම හීන තිබුණා. ඒක අවංකවම මහපොළොවේ පැළ කරන්න ඕනි කියන උවමනාව මට තිබුණා. මේ අයවැයට ඉදිරිපක් තරන්න ගෙනාපු යෝජනා අපි සමසේ බෙදා ගන්න ඕන කරන ඒ පූර්ණ කැපකිරීම කරේ අපේ මන්ත්‍රීවරු දහතුන් දෙනා ඇත්තටම මම මේ වෙලාවේ මූලික ගෞරවය ඔවුන්ට ලබා දෙන්න ඕනි. ඒ අය මට කිසිදු බලපෑමක් කරේ නැහැ. ඒ අයට හැමවෙලාවේම පැහැදිලි කරා මේ තියන එකඟත්වය මොන තරම් යහපත්ද කියලා. අපිට වැඩ කරන්න නම් අපි හැමෝටම මානසික සතුට කියන දේ තියෙන්න ඕනි. ඒනිසා මම කියන දේට සවන් දීලා ගරු උපසභාපතිතුමිය ප්‍රධානව මගේත් එක්ක ඉන්න මන්ත්‍රීවරු දොලොස් දෙනා කරපු කැපකිරීමට මේ ගරු සභාවේදී මගේ ගෞරවය මුලින්ම ප්‍රකාශ කරනවා. ඒවගේම තමා 2018 ඉදලා අලව්ව ප්‍රාදේශීය සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් විදිහට ඉන්නකොට මේ ඉන්න ජ්‍යෂ්ඨ මන්ත්‍රීවරු අපි හැමෝම එකට වැඩ කළේ. ඒ වැඩ කරපු කාලයේ අපි අතර අන්‍යෝන්‍ය අබෝධයක් තිබුණා. මම හිතනවා රටේ ප්‍රාදේශීය සභා ගත්තහම මේ උත්තරේ නම් හැමතැනම හම්බෙයි කියලා හිතන් නැහැ. ඒ නිසා මා සහ ඔබ සියලු දෙනාටම දැඩි සතුටක් තියනවා. අලව්ව ප්‍රාදේශීය සභාව විදිහට ලබන වර්ෂයට අපි හැමෝම එකඟවෙච්චි අයවැයකින් මේ කාර්යය ආරම්භ කරන්න ලැබීම සම්බන්ධව ඔබ සියලුදෙනාටම මේ වෙලාවේ ගෞරවය පුද කරනවා. ඒවගේම මේ සඳහා සුවිශේෂී කැප කිරීමක් ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලය සිදු කළා . නිරන්තරයෙන් විමසීම් කරලා හිතුමතේට තීරණ නොගෙන සාකච්ඡා කරලා හැමොම එකඟ වන විදිහේ අයවැයක් හදන්න සහයෝගය ලබා දුන්නා. ඒ පිළිබඳව ලේකම්තුමියට සහ කාර්ය මණ්ඩලයට නැවත වතාවක් ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම ඔබගේ අදහස් ප්‍රකාශ කිරීම ඇතුළේ මේ ව්‍යාපෘති කියලා මට හඳුන්වලා දුන්නා. හැබැයි ඔබ කවුරුවත් හිතන් නැතුව ඇති අපි වටා තියෙන්නේ මුදල් නැතිකම නෙවේ .උ දාහරණයක් විදිහට සභා ගොඩනැගිල්ල ගත්තොත්, මුදල් නැති ප්‍රශ්නයට වඩා, ඉදි කිරීමට අදාලව නීත්‍යානුකූලව භූමිය පවරා ගැනීමේ ගැටලුව තියෙන්නේ. පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවේ කතා කරලා ඒකට අදාල තැන්වලට යොමු කරලා මුදල් අනුමත කරගෙන තියනවා එහෙන් සැලැස්ම ඉක්මනට එවන්න කියලා ලියුම් ගහනවා. අදාල ඉඩම නිරවුල් කර ගන්නේ නැතිව සැලැස්ම ඉක්මනට යවන්නේ කොහොමද? අපි හිරවෙලා ඉන්නේ එතන. අපි ඉන්න කාලයේ ඇතුළත මේක හදාගන්න එක අපේ හීනයක්. යටම තට්ටුව පාර්කින් එක ,දෙවන තට්ටුවේ කාර්යාලය , තුන්වැනි තට්ටුවේ සභා ගර්භය ලෙස අලව්වේ ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික නිලධාරීන් මඟින් ඉදි කිරිමට අදාලව ගොඩනැගිල්ලේ සැලසුම් ටික හදාගෙන තියනවා. හැබැයි අනුන්ගේ ඉඩමක අපිට සැලසුම් අදින්න බැහැ. ඔබ මතු කරපු කපුවරලේ මා ඔය රක්ෂිතය ආශ්‍රිතව ආයෝජනය කරන්න ඒකට අදාල ව්‍යාපෘති ලේකම්තුමිය සමඟ කතා කළා වැසිකිලි පද්ධති තුනක්ම ඉදි කරන්න මුදල් වෙන් කෙරුවා. ඒ ඔක්කොම ජාත්‍යන්තර තලයේ ඒවා. මේ කාරණා නිසා අපිට අවශ්‍ය දේ මහපොළොවට ගෙනියන්න විදිහක් නැහැ හැබැයි මම ඇත්තටම  මැදිහත් වීමක් කරමින් යනවා. මම හිතනවා එතන තියන ඉඩමේ ප්‍රශ්නය නිරාකරණය කරමින් ආදායම් මාර්ග බවට පත් කර ගන්න පුළුවන් වෙයි කියලා .2026 වර්ෂයේ මුල් කාර්තුව ඇතුළත ඊට අදාල නෛතික තීන්දු තීරණ ගන්න සභාපතිවරයා විදිහට මැදහත් වීමේ පොරොන්දුව මේ ගරු සභාවට දෙනවා. ඔබ දන්නවා වැටුප් ප්‍රතිපූර්ණය සියයට හතලිහක්. ගිය වර්ෂයේ එක් කෝටි හැටපන් ලක්ෂයක් වෙන් කරලා තියන එක මේ සැරේ කෝටියයි කියලා  කීප දෙනෙක්ම මතු කරා.  මේ අයවැය තුළ වැටුප් ප්‍රතිපූර්ණ සඳහා මුදල් වෙන් කරගන්න ඕනි. හැබැයි කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභි ප්‍රාදේශීය සභා කිහිපයක් අපි හඳුනගෙන තියනවානේ අපිත් ඉන්නවා කියලා හිතනවා. ඉදිරියේදී අපි වගේ මේ දුප්පත් සභාවලින් මේ වැටුප් ප්‍රතිපූර්ණය කරන එක නවත්තන්න එපා කියන ඉල්ලීම කරන්න සාකච්ඡා කරලා තියනවා. වෙනම සංවිධානයක් විදිහට දැනට ඒ ගැන සාකච්ඡා කරමින් යනවා. ඒ නිසා මේ තියන අර්බුද ජයග්‍රහණය කරගන්න ඔබේ සභාපතිවරයා විදිහට හැමතැනකටම මැදිහත් වීම මම අනිවාර්යෙන්ම කරනවා.

අලව්ව නගරයේ ගුවන් පාලම හරහා අපිට ආදායම් මාර්ග ගණනාවක් පිළිබඳව හීන දකිනවා නිකම්ම ගලාගෙන යනවා නෙවේ, 2026 වර්ෂයට ලොකු ව්‍යාපෘති ගණනාවක් සැලසුම් කරගෙන තමා පා තබන්නේ. ඉතින් ඔබ සියලු දෙනාගේම සහ මේ නිලධාරීන් හැමෝගේම සහයෝගය මත මේ හීන ටික සැබෑ කරගමු. ඉදිරි වර්ෂයේදී අපි හැමෝම ඒකේ සතුටු භුක්ති විඳිමු. ඒ අනුව, ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වු ගරු උප සභාපතිතුමිය ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්,ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ටත් ස්තූතිය පල කරන අතර විශේෂ මහා සභාවේ කටයුතු මෙයින් නිමා කරනවා.

මෙදින ප.ව 11.45 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

ඉහත සඳහන් වාර්තාව 2025.11.13 දින පැවති මහ සභාවේදී ස්ථිර කරන ලද බව සහතික කරමි.

2025.11.13
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.